ආඛ්‍යාන narrations
**Volume 07 | Issue 01 | January - June 2022 | Article 07**
**ISSN 2478-0642**

On-line Refereed Journal of the Center for Indigenous Knowledge and Community Studies
Sabaragamuwa University of Sri Lanka
Follow this and additional works at: www.sab.ac.lk
e-mail: director@cikcs.sab.ac.lk

CC BY NC ND

# මැදරට ජන කණ්ඩායම් කිහිපයක් පිළිබඳ සංස්කෘතික මානවවිද්‍යාත්මක විග්‍රහයක්

**තුෂාර කමලරත්න**, සමාජ විද්‍යා අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය,
thushara.kamalrathne@hud.ac.uk

**සාරසංක්ෂේපය**

මෙම ලිපියෙහි මුඛ්‍ය අරමුණ වන්නේ මධ්‍යම පළාත ආශ්‍රිතව ජීවත් වන ජනවාර්ගික වශයෙන් සහ කුල වශයෙන් සංවිධානය වී ඇති සහ කාලාන්තරයක් තිස්සේ සුවිශේෂී සංස්කෘතික අනන්‍යතාවයක් පවත්වා ගනිමින් ජීවත් වන ජන කණ්ඩායම් කිහිපයක් පිළිබඳව මානවවිද්‍යාත්මක විග්‍රහයක් සිදු කිරීමයි. ඒ අනුව ජනවාර්ගික කණ්ඩායම් වශයෙන් ජන කණ්ඩායම් තෝරාගෙන තිබෙන්නේ ඔවුන්ගේ සමාජ-ඓතිහාසික සාධක සහ මධ්‍යම පළාතෙහි මෙම ජනකණ්ඩායම්වල ව්‍යාප්තිය සැලකිල්ලට ගනිමිනි. ඇතැම් සම්ප්‍රදායික කුල කණ්ඩායම් මෙහි සාකච්ඡාවට ගෙනඇත්තේ ඔවුන් පිළිබද බැඳී පවතින සංස්කෘතික වටිනාකම් සහ අනන්‍යතාවය ක්‍රමිකව ගිලිහී යන හෙයිනි. මෙම ලිපිය ඓතිහාසික සහ මානවවංශ ලිඛිත මුලාශ්‍රය ඇසුරින් සම්පාදනය කොට ඇත. සංස්කෘතික විශේශීතාවය සහ අනන්‍යතාවය සැලකිල්ලට ගනිමින්, ප්‍රාග් ඓතිහාසික ගෝත්‍රික කණ්ඩායම්, වැදි ජනතාව, කින්නර සහ රොඩී යන කුල කණ්ඩායම්, ජනවාර්ගික වශයෙන් පෘතුගීසි සිංහල හෙවත් දොන් ජන කණ්ඩායම, වතු ද්‍රවිඩ ජනතාව සහ මධ්‍යම ප්‍රදේශය ආශ්‍රිතව ජීවත්වන මුස්ලිම් ප්‍රජාව පිළිබද විග්‍රහයක් මෙම ලිපියෙහි අන්තර්ගත වේ. මෙම ජන කණ්ඩායම් පිළිබද විග්‍රහය ඓතිහාසික විශ්ලේෂණයකට පමණක් සීමා කර ඇති අතර ජනකණ්ඩායම් හි සම්භවය සහ විකාසනය ඓතිහාසික මුලාශ්‍රමගින් එක්රැස්කරගත් තොරතුරු ඇසුරින් විග්‍රහ කර ඇත.

**ප්‍රමුඛ පද:** *වැදි ජනතාව, කින්නර ජනතාව, රොඩී ජනතාව, පෘතුගීසි සිංහලයෝ, වතු ද්‍රවිඩ ජනතාව*

## හැඳින්වීම

මැදරට ඓතිහාසික කාල වකවානුවල මෙන් ම අද්‍යතනයේත් ශ්‍රී ලාංකේය සමාජයේ සුවිශේෂී අනන්‍යතාවක් රැඳි භූගෝලීය කලාපයකි. ඊට හේතුව එය භූගෝලීය වශයෙන් මෙන් ම සමාජ සංස්කෘතික සාරයෙන් යුත් ප්‍රදේශයක් ලෙස කාලාන්තරයක් තිස්සේ පැවතීම යි. භූගෝලීය වශයෙන් ශ්‍රී ලංකාවේ මධ්‍යම කඳුකරය ඇසුරින් නිර්මාණය වූ මැදරට ප්‍රදේශය තවමත් සිංහල සමාජ සංස්කෘතික සභ්‍යත්වයේ ඉතා සුවිශේෂී කේන්ද්‍රස්ථානයක් වශයෙන් සැලකිය හැකිය. එක් අතකින් සමස්ත ලංකාවාසීන්ටම වැඩ සදන මහා ගංගාවෝ සමූහයම ආරම්භ වන මධ්‍යම කඳුකරය ස්වාභාවික සම්පත්වලින් ආඪ්‍ය භූමියකි. එබැවින් ශ්‍රී ලාංකේය සමාජයට අවැසි ස්වාභාවික සම්පත්වලින් බහුල ජල පෝෂක ප්‍රදේශ මෙම භූගෝලීය නාභිය ඔස්සේ නිර්මාණය වී ඇත. අනෙක් අතට මෙම

ප්‍රදේශය සංස්කෘතික කේන්ද්‍රස්ථානයක් ලෙස දීර්ඝකාලයක් තිස්සේ විවිධ භූ දේශපාලනමය වෙනස්කම්වලට භාජනය වී ඇත.

හැල්ෆ්‍රඩ් මැකින්ඩර් (1904) විසින් ඉදිරිපත් කළ හදබිම සංකල්පය (Heartland)[16] අනුව සී. එම්. මද්දුමබණ්ඩාර මහවැලි වංශයෙහි "සිංහලේ හද බිම" වශයෙන් රුහුණ, රජරට හා උඩරට කලාපයන්හි පෙරදිගට බර වූ භූමිය සුවිශේෂී කලාපයක් ලෙස හඳුනා ගනී[17] . මෙම භූමි ප්‍රදේශය භූ දේශපාලනමය විභවතාවයක් සහිත ප්‍රදේශයකට වඩා මෙරට සමාජ සංස්කෘතික අනන්‍යතාවයන් සහිතව චිරාත් කාලයක් හෙළ සභ්‍යත්වය පෝෂණය කිරීම එක් හේතුවකි. මෙම හදබිම කලාපයෙහි මැදරට පෙදෙසට හිමි වන්නේ විශේෂ වැදගත්කමකි. ඊට හේතු කිහිපයකි. ඉහත සඳහන් කළ සුවිශේෂී භූගෝලීය පසුබිමකින් යුත් කලාපයක් ලෙස මෙරට භූගෝලීය නාභිය ලෙස ඉටුවන සේවය ඉන් එකකි. අනෙක් අතටල අද දක්වාත් මෙම ප්‍රදේශ මෙරට සංස්කෘතික අනන්‍යතාව ප්‍රකාශ කරන සුවිශේෂී භූමියක් ලෙස සැලකිය හැකි අතර බෞද්ධ අනන්‍යතාවයේ ප්‍රමුඛ ස්ථානයක් වූ ශ්‍රී දළදා මාලිගාවත් ඒ වටා කේන්ද්‍රගත වූ ලංකාතිලකය, ගඩලාදෙණිය, ඇම්බැක්ක, හිඳගල රජමහා විහාරය, අළුවිහාරය, දඹුල්ල, අරත්තන විහාරය, රන්පත්ගේ රජමහ විහාරය, පොත්ගුල් විහාරය, දෙගල්දොරුව, මැදවල ටැම්පිට විහාරය, පිදුරංගල වැනි බෞද්ධ පුදබිම් සහ සීගිරිය වැනි සංස්කෘතික කේන්ද්‍රස්ථාන කාලාන්තරයක් තිස්සේ නිහඬව ශ්‍රී ලාංකේය අනන්‍යතාව ආරක්ෂා කිරීම තවත් කරුණක් වේ.

"ශ්‍රී ලංකාවෙහි ද ජාතියේ අග්‍රතම සංස්කෘතික සංකේතය ශ්‍රී දළදා වහන්සේ මගින් දීර්ඝ කාලයක් ම නියෝජනය කෙරිණි. ශ්‍රී දළදා වහන්සේ එකල ශ්‍රී ලංකාවේ රාජ්‍ය බලයෙහි ද අග්‍ර සංකේතය වූ අතර නියම රාජ්‍ය බලය පිහිටියේ එය සතු අය වෙත බව ඉතිහාසයෙන් මනාව පැහැදිලි වේ."[18] තව ද මෙම ප්‍රදේශයේ පාලන බලයට අභියෝග කිරීම සුළුපටු කරුණක් නොවූ අතර ඓතිහාසික කාල වකවානුවල පවා මැද රට දේශපාලන භූමිකාව ඉතා සුවිශේෂී සංදිස්ථානයක් ලෙස සැලකිණ. එයට හේතුවල යම් හෙයකින් මෙරට පාලන බලය හිමි කර ගැනීමට නම් යමෙකුට මැදරට දේශපාලන භූමිකාව අතිශය වැදගත් වීමයි. මෙම හේතු සාධක වඩා විශ්ලේෂණාත්මකව සලකා බලන විට මහනුවර කේන්ද්‍රකරගත් මැදරට කලාපය මෙරට භූ දේශපාලන හා සමාජ සංස්කෘතික හද බිම වශයෙන් සැලකීමට සංකීර්ණ හේතු සාධක රාශියක් ඇති බව පෙනෙන්නට තිබේ.

මැද රට සංස්කෘතික අනන්‍යතාවය පිළිබඳ සාකච්ඡා කරන විට මෙම ප්‍රදේශයේ කාලාන්තරයක් තිස්සේ ජීවත් වූ ජන කණ්ඩායම්වලට හිමි වන්නේ සුවිශේෂී වැදගත්කමකි. ඔවුහු එක් අතකින් අප අදටත් අත්විඳින, අගයන ඇතැම් සංස්කෘතික ශේෂයන් හී නිමැවුම්කරුවෝ වෙති. එබැවින් ම මෙම ප්‍රදේශය තුළ ජීවත් වූ අනු ජන කණ්ඩායම් පිළිබඳ සොයාබැලීමත් ඒ පිළිබඳ කතිකාවක් ගොඩ නැගීමත් අත්‍යවශ්‍ය වන්නේ ය.

**ප්‍රාග් ඓතිහාසික මානවයා සහ ගෝත්‍රික ජන කණ්ඩායම්**

ශ්‍රී ලංකාවේ මානව සම්භවය හා එහි පරිණාමය පිළිබඳ ඓතිහාසික මූලාශ්‍රයන් හා පුරාවිද්‍යාත්මක ගවේෂණයන් මඟින් දැනට වසර දහස් ගණනකට පෙර පැවති ප්‍රෞඪ ඉතිහාසයකට සාක්ෂි සපයා දී තිබේ. ප්ලයිස්ටෝසීන් (pleistocene) යුගය වන විටත් ලංකාවේ ආදී මානවයන් ජීවත් වූ බව තහවුරු කරගැනීමට අවශ්‍ය සාධක ඇති බව දැරණියගල පෙන්වා දෙයි[19]. වානර මානවයෙකු ලෙස සැලකෙන හෝමෝ පිතකස් (homo pithecñ) හා බොහෝ පැරණි මානවයෙකු බවට සැලකිය හැකි හෝමෝ සිංහලේයුස් (homo sinhaleyñ) පිළිබඳ කෙරුණු ගවේෂණයන්හි දී අවුරුදු පනස්දහකටත් විසිදහකටත් අතර පැරණි යැයි කාල නිර්ණය කරන ලද

[16] Halford Mackinder, "The Geographical Pivot of History," G. J, Vol. I, 1904.

[17] සී. එම්. මද්දුමබණ්ඩාර, "මහවැලිය සහ සිංහලයේ හදබිම," **මහවැලි වංශය**, I කාණ්ඩය, මහවැලි සංවර්ධන අමාත්‍යාංශය: ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය, 1984, පිටු. 45-46.

[18] මද්දුමබණ්ඩාර, **එම**, 1984, පි. 48.

[19] ශිරාන් දැරණියගල, "ප්‍රාග් ඓතිහාසික පසුතලය," **මහවැලි වංශය,** I කාණ්ඩය, මහවැලි සංවර්ධන අමාත්‍යාංශය: ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය, 1984. පි. 61.

පුරාවිද්‍යාත්මක සාක්ෂ්‍ය හමුවී ඇත[20]. එබැවින් මානව සම්භවය පිළිබඳව සිදු කෙරුණු පුරාවිද්‍යාත්මක ගවේෂණ අනුව ලොව පැරණිම පුරාවිද්‍යාත්මක සාක්ෂ්‍ය ලැබෙන රටක් වශයෙන් ශ්‍රී ලංකාව ගැණිය හැකිය.

ශ්‍රී ලංකාවේ මධ්‍ය ශිලා යුගයේ ජීවත් වූ "බලංගොඩ මානවයා" පිළිබඳ අධ්‍යයනයන් මානව සම්භවය සහ පරිණාමය පිළිබඳ ඉතා වැදගත් තොරතුරු රාශියක් නිෂ්පන්න කොට තිබේ. "ලංකාවේ මධ්‍ය ශිලා යුගය ක්‍රි. පූ. 11,000-1000 දක්වා පැවති අතර මෙම කාල නිර්ණ දින වකවානු ලැබී තිබෙන්නේ විශේෂයෙන්ම බෙල්ලන්බැඳි පැලැස්ස, මානියම්ගම අසල බෙලි ලෙන, බුන්දල, හෙනගහපුගල, කිතුල්ගල යන ඓතිහාසික ස්ථාන ඇසුරෙන් කළ පර්යේෂණවලිනි."[21] දැනට පර්යේෂණයන්ට බඳුන් කොට ඇති මෙම බලංගොඩ සංස්කෘතිය සහ බලංගොඩ මානවයා පිළිබඳ තොරතුරු ශ්‍රී ලංකාවේ මානව ශිෂ්ටාචාරයේ ආරම්භය මෙන් ම විවිධ ජන කණ්ඩායම් හි සම්භවය පිළිබඳ සාකච්ඡාවේ ඉතා වැදගත් සංධිස්ථානයකි. ඊට හේතුව ශ්‍රී ලංකාවේ මානව ජනාවාසයන් හි ආරම්භය ආර්යය සංක්‍රමණ සමඟ සිදුවූයේ ද එසේත් නැතහොත් මහාවංශය සඳහන් කරන පරිදි විජයාගමනයට පෙර සිටම ශ්‍රී ලංකාවේ සිටි මානව කණ්ඩායම් හි පරිණාමය ඔස්සේ සිදු වී ද යන විවාදාත්මක සාකච්ඡාවට ගෝචර වන සාක්ෂ්‍යයන් සපයන බැවිණි. එබැවින් ශ්‍රී ලංකාවේ ජන කණ්ඩායම් හි ආරම්භය හා පරිණාමය පිළිබඳ කතිකාවට මෙම ඓතිහාසික පසුතලයන්ගෙන් ලැබෙන්නේ නොමඳ වූ අධ්‍යයන සහයකි.

පුරාවිද්‍යාත්මක හා ඓතිහාසික මූලාශ්‍රයන් පරිශීලනයෙන් මෙරට මූල ජානපදික සංක්‍රමණයට බොහෝ කලකට පෙර සිටම මානව කණ්ඩායම් හා අනුයාත වූ ශිෂ්ටාචාර පැවති බවට තොරතුරු සපයාගත හැකිය. "වංසකථා සාහිත්‍යයට අනුව මෙරට ආර්යයන් ගොඩ බැසීමත් සම්බුද්ධ පරිනිර්වාණයත් එකම දිනයක සිදු වූ බව දක්වා ඇත. ලක්දිව පැවත එන සම්ප්‍රදායට අනුව මෙම දිනය අයත් වන්නේ ක්‍රි. පූ. 543 වැනි වර්ෂයට ය."[22] පවතින සාක්ෂ්‍ය අනුව මෙරට උතුරු ඉන්දීය සංක්‍රමණය සිදු වන්නේ ක්‍රි. පූ. සවන සියවස තුළ දී ය. නමුත් පුරාවිද්‍යාත්මක තොරතුරු අනුව මෙරට මානව ශිෂ්ටාචාරයන්හි ආරම්භය මූල ජානපදික සංක්‍රමණයට වඩා ඉතා පැරණි කාල වකවානුවක් දක්වා දිව යන්නකි. ඉහත සඳහන් කළ ශ්‍රී ලංකාවේ මධ්‍ය ශිලා යුගයේ පැවති බලංගොඩ සංස්කෘතියත් ඊටත් වසර දහස් ගණනකට පෙර පුරාවිද්‍යාඥයන් විසින් අනාවරණය කරන ලද මානවයින් හා ඔවුන්ගේ මෙවලම් ආදිය පිළිබඳ තොරතුරුත් මෙරට ආර්යයන්ට පෙර පැවති මානව ශිෂ්ටාචාරයන් පිළිබඳ සාකච්ඡාවට වඩා පුළුල් පදනමක් සපයයි. පුරාවිද්‍යාත්මක සාක්ෂි මෙන් ම ලිඛිත සාහිත්‍යය මූලාශ්‍රය ද මෙම පසුබිම වඩා හොඳින් විශ්ලේෂණය කිරීමට අවශ්‍යය සාධක සපයා දී තිබේ. විශේෂයෙන් මුල් විදේශ සංක්‍රමණයන්ට පෙර මෙරට සිටි යක්ෂ සහ නාග ගෝත්‍රිකයන් පිළිබඳ තොරතුරු වංසකථා සාහිත්‍යය තුළ ඉතා පුළුල් ලෙස විග්‍රහ කොට ඇත.[23] බුදුරජාණන් වහන්සේ ජීවමාන කාලයෙහිදී ම මෙරටට වැඩම කළ සියලු අවස්ථාවන් සම්බන්ධ වන්නේ ඉහත කී ගෝත්‍රික කණ්ඩායම් අළලා සිදු කෙරුණු සංසිද්ධීන් තුළ ය. උදාහරණ වශයෙන් උන්වහන්සේගේ ප්‍රථම ලංකාගමනය යක්ෂයින් දමනය කිරීමට මහියංගණයටත් ඉන් අනතුරුව නාග ගෝත්‍රික රජවරුන් වන චූලෝදර හා මහෝදර අතර මැණික් පුටුවක් අරබයා සිදු වූ යුදය සංසිඳුවීමටත් ආදී වශයෙන් මෙරටට වැඩි බව වංසකථා සාහිත්‍යය දක්වා තිබේ.

> "සම්‍යක් බෝධියෙන් නව වන දුරුතු පුර පසළොස්වක් හි ලඞකාද්වීපය ශුඩකරනු පිණිස ලක්දිවට පැමිණි සේක- සර්වඥයන් වහන්සේ විසින් ලඞකාතොමෝ සසුන් බබලන තැනෙකැයි ද, යකුන් විසින් පිරුණු ලක්දිව යක්ෂයෝ බැහැර කටයුතුයැයි ද දන්නා ලදී" [24]

---

[20] **එම.**

[21] **එම.**

[22] තිලක්, හෙට්ටිආරච්චි, "මහවැලි කලාපයේ ඓතිහාසික විකාශනය; ජනපද ඇතිවීම," **මහවැලි වංශය**, I කාණ්ඩය, මහවැලි සංවර්ධන අමාත්‍යාංශය: ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය, 1984, පි. 65.

[23] **මහාවංශය**, තෘතීය මුද්‍රඩකනය, පරි: හික්කඩුවේ නායක ස්ථවීරපාදයන් වහන්සේ සහ දොන් ආන්ද්‍රිස් ද සිල්වා බටුවන් තුඩාව, ආණ්ඩුවේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, 1952, පරි. 1, ගාථා. 19-21.

[24] **එම**, පරි. 1, ගාථා. 45-48.

බුදුරජාණන් වහන්සේගේ දෙවන ලංකාගමනය පිළිබඳ මහාවංසය දක්වන්නේ පහත පරිදි ය.

> "සම්‍යක් සම්බෝධියෙන් පස්වෙනි වස ජේතවන විහාරයෙහි වැඩවසන සේක් මහෝදර නාගය, එසේම චූලෝදර නාගය යන පිරිස් සහිත වූ නාගයන්ගේ මිණිපළඟ හේතු කොට එළඹ සිටියා වූ යුධය දැක, බක්මස අමාවක් පොහොදින උයද කාලයෙහිම උතුම් වූ පා සිවුරු ගෙන නාගයන්ට අනුකම්පා පිණිස නාගදීපයට වැඩි සේක"[25]

මෙරට මුල්ම මානව කණ්ඩායමක් ලෙස සැලකෙන යක්ෂ ගෝත්‍රිකයන් පිළබඳ සංවාදය ශ්‍රී ලාංකේය මානව ජනාවාසකරණයේ දී ඉතාමත් වැදගත් සංදිස්ථානයකි. විශේෂයෙන් ශ්‍රී ලාංකේය මානව සම්භවය පිළිබඳ කතිකාවේ දී මෙම යක්ෂ ගෝත්‍රිකයන්ගේ ශිෂ්ටාචාරය හා පරිණාමීය කරුණු පිළිබඳ පුරාවිද්‍යාව, මානවවිද්‍යාව හා ඉතිහාසය යන විෂයයන්ගේ පර්යේෂණ අවධානය වඩා පුළුල්වීම සිදු විය යුතු බව මෙහිලා දැක්විය යුතුය. කෙසේ වෙතත්ල යක්ෂ ගෝත්‍රික කණ්ඩායම හා මහා රාවණා රජු පිළිබඳව පුරා කථා භාරතීය දේව සාහිත්‍ය දක්වාම දිව යයි. සුප්‍රසිද්ධ රාමායනය කෘතිය ඊට කදිම නිදසුනකි. මෙරට ලිඛිත සාහිත්‍යයෙහි පවා විජයාගමනයටත් බුද්ධාගමනයටත් පෙර පැවති මෙම ශිෂ්ටාචාරය පිළිබඳ තොරතුරු සැපයීමට මුල්කාලීන සාහිත්‍යකරුවන් යම් සාධනීය රුචියක් දක්වා ඇති බව පෙනෙනන්නට තිබේ. විවිධ ප්‍රදේශයන්හි කඩයිම් පොත්වල පවා පුලස්ථි ඍෂිගේ පුත්‍රයෙකු වන රාවණා පිළිබඳ වර්ණනාවන් එක් කිරීමට කතුවරුන් උත්සහ ගෙන තිබීම ඊට කදිම නිදසුනකි. රාවණා රාජාවලිය හා මාතලේ කඩයිම් පොත යන ද්විත්වයෙහි ම ආරම්භය සනිටුහන් වන්නේ පහත පරිදිය.

> "තවද ක්‍රෙතා යුගය, ත්‍රෙතා යුගය, ඩාපර යුගය, කලි යුගය යි යුග සතරක් වෙයි. මේ යුග සතරින් එක් යුගයකදී පුලාස්ථි හට දාව අසුර කන්‍යාව වැදූ රාවණා නම් රජ්ජුරුවෝ රාජ ධර්මය වරදවා, ලෝ සසුන් රැක්මක් නොකොට දෙවියන්, බුදුන්, තපස්වරයන්, ශ්‍රමණය, බ්‍රාහ්මණයන් ආදීන්ට ගරු නොකොට අය ගනිමින් නන්ද මූල පර්වතයෙහි වසන තපස්වරයන් පසේ බුදුවරයන් ආදීගෙන් දක්වා කිසිත් යම් දෙයක් ගෙනවයි කියා අය පඬුරු ගනිමින් ලංකා රාජ්ජයෙහි එකසියයක් රාජධානි ඇති කරවා දඹදිව රජුන් සේවක නොකොට දෙව්ලොව, අසුර ලොව, ගරුඬ ලොව, නාරජුත් සිරගෙයි ලා ඔවුන් අතින් අය බදු ගනිමින් චන්ද්‍ර සූර්යය දිව්‍ය රාජයන් හා ග්‍රහයන් බැද සිරකොට ඔවුන් අතින් ද මෙහෙ ගනිමින් ඔහුගේ නුවර උඩින් හිරු සඳු දෙදෙනා ආලෝක පතුරුවා ඉවතින් යන්නාහ"[26]

මෙසේ රාවණයන්ගේ තේජෝබල පරාක්‍රමයන් පිළිබඳ සාහිත්‍ය කරුණු දක්වන අතර රාවණ ප්‍රමුඛ යක්ෂ ගෝත්‍රිකයන්ගේ මුල්ම වාස භූමි වශයෙන් ලිඛිත හා ජන මූලාශ්‍රිත සාක්ෂ්‍ය ඇසුරින් දැක්විය හැකි ප්‍රදේශ වශයෙන් මධ්‍යම පළාත සහ ඒ ආසන්නයට අයත් මහියංගණය, ගුරුළු පොත, ලග්ගල පල්ලේගම, මී මුරේ, රණමුරේ, ඕපල්ගල, හාවා එලිය, සීතා එළිය, වැනි ප්‍රදේශයන්ට වැඩි වැදගත්කමක් හිමි වේ. මෙහි දී මහියංගණය පිළිබඳ වංසකථා සහ අනෙකුත් ලිඛිත මූලාශ්‍රයන්ගෙන් අවශ්‍යය තොරතුරු සම්පාදනය කරගත හැකි වුව ද අවශේෂ උප ප්‍රදේශ පිළිබඳ හමුවන ලිඛිත මූලාශ්‍රයන් ඉතාම අල්ප ය. එසේ වුව ද පවතින ලිඛිත මූලාශ්‍රයන්ගේ දත්ත ස්ඵුට කරගැනීම උදෙසා මානවවිද්‍යාත්මක හා පුරාවිද්‍යාත්මක දත්ත මෙන් ම ජනශ්‍රැතිය ආශ්‍රිත තොරතුරු ද මේ සඳහා භාවිත කළ හැකිය.

යක්ෂ ගෝත්‍රිකයන්ගේ වාසභූමි පිළිබඳව සලකා බලන විට මහියංගණයට හිමිවන්නේ සුවිශේෂ ස්ථානයකි. ඊට හේතුව වංසකථා මූලාශ්‍රයඅනුව මොවුන්ගේ ජානපදික භූමියක් පිළිබඳව ප්‍රථම ලිඛිත සාක්ෂි හමුවන්නේ මහියංගණය ආශ්‍රිතව වීමයි.

---

[25] **මහාවංශය**, 1952, පරි. 1, ගාථා. 21-22.

[26] ගණනාථ ඔබේසේකර, **රාවණා රාජාවලිය සහ උපත් කථා,** කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ, 2005, පි. 33.

"ලංකාද්වීපය මධ්‍යයෙහි මනෝරම්‍ය වූ ගං ඉවුරෙහි තුන් යොදුන් දිගු එක්යොදුන් පුළුල් වූ රම්‍ය වූ මහානාග වන නම් උයනෙහි යක්ෂයන්ගේ යුධ භූමියෙහි ලක්දිව වැසි යකුන්ගේ මහා නිසාචර සමාගමය ප්‍රසිඬමය"[27]

තව ද වංසකථා සාහිත්‍යයට අනුව මහියංගණයට වැඩම කළ බුදුරදුන් යක්ෂයින් දමනය කොට ගිරි දිවයිනට පලවා හැරි බව දක්වා තිබේ. ඒ බව මෙසේ දක්වයි.

"ඉක්බිත්තෙන් සර්වඥයන් වහන්සේ ඔවුන්ට රම්‍ය වූ ගිරි දිවයින මෙහි ළඟා කළ සේක. උන් එහි වන් කළ තිබූ තන්හිම තැබූ සේක"[28]

සත්‍යය වශයෙන් ම මෙම ගිරි දිවයින මහවැලි නදියෙන් මෙපිට වූ කඳුකර කලාපයම විය හැකිය. විශේෂයෙන් මාතලේ දිස්ත්‍රික්කයෙහි ලග්ගල පල්ලේගම සහ මහනුවර දිස්ත්‍රික්කයෙහි කඩයිම් සීමාවෙහි පිහිටා ඇති මීමුරේ හා රණමුරේ ආශ්‍රිත ප්‍රදේශයන්හි සිදු කෙරුණු මානව වංශ පර්යේෂණයන්ගේ ඇතැම් සාධක මෙම තර්කය පැහැදිලි කර ගැනීමට යොදා ගත හැකිය.

චීන තෙරුන්ගේ ගමන් විස්තරය හා හියුංසියං භ්‍රමණ වෘත්තාන්තය දක්වන පරිදි "මේ ද්විපයේ ගිණිකොණ දෙසැ ලංකා පර්වතය පිහිටියේ ය. ඒ පර්වතයාගේ ගැඹුරු ප්‍රපාතයන්හිත් සමතටයන්හිත් අමනුෂ්‍යයෝ වාසය කරත්, බුදුරදුන් විසින් ලංකාවතාරසූත්‍රය දෙසන ලද්දේ මෙහිදීය"[29] මෙසේ බුදුරජාණන් වහන්සේ ලංකාවතාර සූත්‍රය දෙසන ලදැයි සඳහන් කරන ලංකා පර්වතය මහනුවර හා මාතලේ දිස්ත්‍රිකයන්හි සීමාවේ පවතින ලකේගල විය යුතුය. ලක්ගල හා ලකේගල ව්‍යවහාරික වශයෙන් ලංකා පර්වතය වශයෙන් භාවිත වන බව පැහැදිලි ලෙසම අනුමාන කළ හැකිය. අනෙක් අතට ලග්ගල හා ඒ ආශ්‍රිතව පිහිටි මී මුරේ, රණමුරේ සහ ඕපල්ගල ආශ්‍රිත ජනශ්‍රැතිය හා බොහෝ සංස්කෘතිකාංග රාවණා රජු හා යක්ෂ කණ්ඩායම් පදනම් කරගනිමින් පැවතීම ඉහත සාකච්ඡාවට ගෝචර වන වලංගු සාධකයෝ ය. ලග්ගල පල්ලේගම ප්‍රදේශයේ අදටත් පවතින යක්කම ශාන්ති කර්මය සිදු කරන්නේ ගලේ බංඩාර, සෙල්ලවි බංඩාර, බ්‍රාහ්මණ බංඩාර හෙවත් මහා රාවණා රජු ප්‍රමුඛ කරගනිමින් ය. එසේම ප්‍රාදේශීය දෙවිවරු කිහිප දෙනෙකුට අමතරව සමස්ත ශාන්තිකර්මයේම ප්‍රධාන ස්ථානයක් ගනු ලබන්නේ යක්ගේ තුළ සිටින අවශේෂ යක්ෂ මණ්ඩලයයි.[30],[31] එබැවින් මෙම කඳුකර කලාපය රාවණා ප්‍රමුඛ යක්ෂ ගෝත්‍රිකයන්ගේ වාස භූමි වූ බවට බොහෝ සාක්ෂ්‍ය සපයාගත හැකිය.

මේ නිසා ම ලංකාවේ මානව ශිෂ්ටාචාරයෙහි ඓතිහාසික යුග පිළිබඳව සාකච්ඡාවට යක්ෂ ගෝත්‍රික කණ්ඩායම පිළිබඳ විග්‍රහය අත්‍යවශ්‍යය වන්නකි. වංසකථා පමණක් නොව දේශාටන සාහිත්‍යය පවා ඊට අවශ්‍ය කරන්නා වූ තොරතුරු ග්‍රහණය කරගත හැකි මූලාශ්‍රයෝ ය. "මේ ද්වීපයෙහි උපදන රත්න වර්ගයක් නිසා පූර්වයේදී මෙය රත්නද්වීප නම් විය. එකල්හී එය අමනුෂ්‍යයන්ගේ වාසභූමියකි"[32] උක්ත සඳහන හියුංසියං දේශාඨනයෙහි එන සඳහනකි. එපමණක් නොව මානව සම්භවය පිළිබඳව ශ්‍රී ලංකාවේ සිදු කරන පුරාවිද්‍යාත්මක පර්යේෂණයන් ද

---

27 **මහාවංශය**, 1952, පරි. 1, ගාථා. 30.
28 **එම.**
29 පොල්වත්තේ බුධදත්ත හිමි, **චීන තෙරුන්ගේ ගමන් විස්තර හා හියුංසියං භ්‍රමණවෘතාන්තය**, අම්බලම්ගොඩ: ආනන්ද පොත් සමාගම, 1961, පි. 323.
30 H. M. D. R, Herath, Rasnayake, S., and Kamalrathne, T. **Either God or Devil: Beyond the Buddhism- An Anthropological View of Yakkama Ritual**, Vol XVI, Peradeniya University Research Session: Proceedings, University of Peradeniya, 2011, p. 206.
31 Thushara Kamalarathne & Susantha Rasnayake, **An Anthropological Study of an Ideological Contradiction & the Dilemma of Positioning Goddess Pattini in the yakkama Ritual**, 5th Research Conference, Colombo: The Royal Asiatic Society, 2012, pp. 304-305.
32 බුධදත්ත හිමි, **එම**, 1961, පි. 316.

ඉහත සාකච්ඡා කරන අදහස ස්ඵුට කිරීමට අවශ්‍ය තොරතුරු සපයා දෙයි. "තව ද ශ්‍රී ලංකාවේ වංසකථාවල දැක්වෙන එවක ජීවත් වුණු යක්ෂ ගෝත්‍රිකයින් බලංගොඩ මානවයාට අයත් ජන කොටස් බවට ඔප්පුවී ඇත."[33]

**වැදි ජනතාව**

ශ්‍රී ලාංකේය මානව ශිෂ්ටාචාරයේ මුල් උරුම කරුවන් ලෙස වැද්දන් මෙම ඓතිහාසික විග්‍රහයට අත්‍යවශ්‍යයෙන්ම සම්බන්ධ වන්නේ ය. ශ්‍රී ලංකාවේ ආදිතමවාසීන් විෂයෙහි භෞතික හා සංස්කෘතික වශයෙන් ගැණිය හැකි බොහෝ තොරතුරු වැදි ජනයා ඇසුරින් ගොනුකළ හැකිය. ඓතිහාසික ලිඛිත මූලාශ්‍රයන් මානවවංශ පර්යේෂණ සහ පුරාවිද්‍යාත්මක පර්යේෂණ ඇසුරින් වැදි ජනතාව පිළිබඳ ඓතිහාසික විග්‍රහයක යෙදීමට හැකියාව ඇත. එහි දී පෙනීයන එක් කරුණක් වන්නේ උක්ත සාකච්ඡා කළ මානව සම්භවය සහ එහි රේඛීය පරිණාමය පිළිබඳ විග්‍රහයේ ම එක් කොටසක් ලෙස වැදි ජනයා පිළිබඳ කතිකාව ගොනු කළ හැකි බවයි. විශේෂයෙන් පුරාවිද්‍යාත්මක සාක්ෂ්‍ය අනුව පෙර සඳහන් කළ යක්ෂ ගෝත්‍රිකයින් බලංගොඩ මානවයා හා වැද්දන් පිළිබඳ විග්‍රහයට අනුව මේ සියලු කණ්ඩායම් අප අද සාකච්ඡා කරන මානව කණ්ඩායම්වල රේඛීය පරිණාමයේ විවිධ අවස්ථාවන් ලෙස සැලකිය හැකිය. බලංගොඩ මානවයා කායික වශයෙන් සමාන වනුයේ ලංකාවේ ජීවත් වන වැදි ජනතාවටයි. වැද්දන් බලංගොඩ මානවයාගෙන් පැවත එද්දැයි යන්න පිළිබඳ කිසිදු සැකයක් නැත. දිගු පටු හිස, ඉදිරියට නෙරා ඇති නළල් තලය, සහ හිස් කබල් ඇට, පුළුල් ශක්තිමත් කම්මුල් ඇට, පස්සට නැඹුරු වූ නිකට, ගෙවීගිය විශාල දත් හා මුක්කන් නාසය වැනි කායික ලක්ෂණ බලංගොඩ මානවයා වෙත දක්නට තිබිණි. දකුණු හා අග්නිදිග ආසියානු ප්‍රාථමික ගෝත්‍රික ජන කොටස් අතර ඉහත කී කායික ලක්ෂණ නොයෙකුත් ප්‍රමාණයෙන් දක්නට ලැබේ.[34] හියුංසියං දේශාටන වාර්තාවෙහි ද ඔහු සඳහන් කර ඇති ජනතාව අනිවාර්යයෙන් වැදි ජනතාව විය හැකිය. "ප්‍රමාණයෙන් කුඩා වූ කළු පැහැති රට වැසියෝ නපුරු ස්වභාව ඇත්තෝය......සිංහල මනුෂ්‍යයෝ කළු පැහැති කුඩා ශරීර ද පළල් වූ නිකට ද උස් වූ නළල් ද ඇත්තෝ ය. ඔවුහු ස්වභාවයෙන් ම නපුරුය, සාහසිකය. එසේම නිර්භීතය."[35]

මෙම වැදි ජනතාව ඉහත සඳහන් කළ ප්‍රාකෘතික ජන වර්ගයාගෙන් පැවත එන බවට ඉදිරිපත් වූ කායික ලක්ෂණයන්ට අමතරව සංස්කෘතික ලක්ෂණයන්ගෙන් ද පැහැදිලි කරගත හැකිය. විශේෂයෙන් වැදි ජනයාගේ සංස්කෘතික සංදර්භය ඕනෑකමින් විශ්ලේෂණය කරන්නෙකුට යක්ෂ ගෝත්‍රිකයින්ගෙන් ඔවුහු සෘජුව පැවත එන්නන් බවට හෝ යක්ෂ ගෝත්‍රික සංස්කෘතික පරිචය සමෝධානය කරගත් ජන කණ්ඩායමක් ලෙස හෝ විග්‍රහ කළ හැකිය. වැදි ජනයාගේ ආගමික හා අභිචාර විධීන් හි "යක්ෂ" සංකල්පයට හිමි වන්නේ ඉතා සුවිශේෂී තැනකි. මරණින් පසු භූතාත්මය නෑ යකුන් ලෙස සැලකීම ඉන් ප්‍රධානය. නෑ යකුන් පිදීමේ දී ප්‍රධානීන් වන කන්දේ යකා සහ බිළිඳි යකා, නෑ යකුන්ට අඩුක්කු පිදීම සහ ඔවුන්ගේ ප්‍රමුඛ චාරිත්‍රයක් වන "කිරිකොරහ යාගය" වැනි සියලු ආගමික පිළිවෙත් හා අභිචාරවල සංකල්පීය කේන්ද්‍රය නෑ යකුන්ගෙන් පිළිබිඹු කිරීම යක්ෂ ගෝත්‍රික සංකල්පයන් වැදි සංස්කෘතික පසුතලයට ඉතා සමීප බවට නිදසුන් ලෙස දැක්විය හැකිය.[36]

අදවන විට වැදි ජනයා වෙසෙන කලාපය ඉතා කුඩා ප්‍රදේශයකට සීමාවී පැවතිය ද ඓතිහාසිකව වැදි ජනයා මෙරට විවිධ ප්‍රදේශයන්හි පැතිර පැවති බවට සාක්ෂි තිබේ. "වත්මනේ ඌවේ හා මධ්‍යම පළාතේ කඳුකර භූමි දර්ශනය හැරුණු විට වැදි රට වත්මනෙහි දක්නට ලැබෙන්නේ ප්‍රමාණයෙන් කුඩා බවට පත් ස්වරූපයකිනි."[37] රොබට් නොක්ස්ගේ සඳහනට අනුව බිම්තැන්න මූලික කරගනිමින් ජීවත් වූ වැදි ජනයා අද ඉතා කුඩා භූමි ප්‍රදේශයකට සීමාවී ඇත[38]. "මහනුවර රාජධානී සමයේ දී වැදි ජනයා මාතලේ ප්‍රදේශයේ ද වාසය කළ බවට

---

[33] දැරණියගල, **එම,** 1984, පි. 61.
[34] **එම**, පි. 63.
[35] බුධදත්ත හිමි, එම, 1961, පිටු. 314-316.
[36] සී. ජී. සෙලිග්මාන් සහ වෙනත් අය, **වැද්දෝ,** පරි: චන්ද්‍ර ශ්‍රී රණසිංහ, කොළඹ: ෆාස්ට් පබ්ලිෂින්, 2009, පි. 181-210.
[37] **එම,** පි. 1.
[38] **එම.**

සාධක තිබේ."[39] අදටත් පුරාවිද්‍යාත්මකව වැදගත් වන හැවනේවෙළ සහ ඉබ්බන්කටුව කැණීම් මෙම ප්‍රදේශයන්හි ප්‍රාග් ඓතිහාසික ජන ජීවිතවල තොරතුරු කදිමට අනාවරණය කරන්නා වූ තෝතැන්නක් වේ. කන්ද උඩරට ඈත පළාත්වල රටවැසියන් හා නිතර ගනුදෙනු කරන ගම්වැද්දන් මදක් ශීලාචාර වූ විශේෂයක් වන බවත් ලන්දේසීන්ට විරුද්ධව රාජසිංහ රජු සංග්‍රාමයක් මෙහෙය වූ අවස්ථාවේ දී එක් දිසාපති කෙනෙකු ගෙන ආ සේනා පයිණ්ඩයක් වැදි සෙනඟින් සමන්විත වූ බවත් නොක්ස් දක්වා ඇත[40].

දෙවන රාජසිංහ රජු සමයේ රචනා වී ඇති මාතලේ කඩයිම් පොතට අනුව ද මාතලේ ප්‍රමුඛ වූ වැදි ජනයා හා ඔවුන්ගේ නම්ගම් මෙන් ම වංශ පිළිබඳව ද තොරතුරු මනාව හෙළි වේ.

> "ගොඩපළ රජතුමා නියරේ පොළ අලහකෝන් මොහොට්ටාල ගෙන්වා මාතලේ සිටින මිනිසුන් සහ ගෙවල් මොනවාද ඇසූ විට මොහොට්ටාල මෙසේ පවසයි. ".........ස්වාමීන් වහන්ස, මාතලේ රටේ ගෙවල් තුනයි කියා සැලකළ තැනේදී ගෙවල් තුන මොකදැයි ඇහූ බැළුං කළ තැනේදී ස්වාමීන් වහන්ස උඩුපිහිල්ලේ කුලතුඟ මුදියන්සේත් අළුවිහාර වනිසේකර මුදියන්සේත් දූඹුකොල චන්ද්‍රසේකර මුදියන්සේත් හුලංගමුවේ ගමගේ වැද්දාත් හම්පත් වැද්දාත් මිස නැතැයි කියා සල කළාය. එතැනින් එපිට රට මොකදැයි කියා ඇහුං බැලුං කල තැනේද ස්වාමීනි බිරිඳ වෙලේ හෙල්කඳුරෙන් පල්ල කනන්ගමුවේ කන්නිල වැද්දා හිරකර සිටියාය. නිකකොටුවේ හේරත් වැද්දා හිරකර හිටියාය. දොඹා වැද්දා දොඹවෙලගම හිරකර හිටියාය. වල්ලි වෙල වල්ලි වැද්දා හිරකර හිටිනවාය. මහ කවුඩැල්ලා වැද්දා කවුඩු පැලැල්ලේ හිරකර හිටියාය. නාරංගමුවේ නයිරන් වැද්දා හිරකර හිටියාය. නාලන්දේ ඉමියා වැද්දා හිරකර හිටියාය. දිගහරහා නවගච්චක් නාගපට්ටලමේ දිප්පිටියේ මහගෙ හිරකර හිටියාය. මකර වැද්දාත් කොඳුරුවා වැද්දාත් කඩ ඉම රැක හිටියාය. මහකන්දා වැද්දා කන්ද පල්ල හිරකර හිටියාය. ගලේවෙල හෙම්පිටි මහගෙ හිරකර හිටියාය. උඩුගොඩ කෝරලේ උඩසිය පත්තුවේ බාජුමහගෙ හිරකර හිටියාය. පල්ලෙසියපත්තුවේ මිනිමුතු මහගෙ හිරකර හිටියාය. මේල් පිටියේ දෙවකිත–ති මහගෙ හිරකර හිටිනවාය........"[41]

ජනශ්‍රැතියට අනුව විජය හා යක්ෂ ගෝත්‍රිකයින්ගේ අරගලය ඇතිවූයේ මාතලේ දිස්ත්‍රික්කය ආශ්‍රිතව බව සඳහන් වන අතර කුවේණියගේ පියා වන බම්බා රජුද, ඇගේ මාමලා වන ඉරුගල් බණ්ඩාර, සඳුගල් බණ්ඩාර, කළු බණ්ඩාර හා මුත්තලා වන කුඩා කොහොඹා බණ්ඩාර, මහා කොහොඹා බණ්ඩාර වැන්නන් ද මාතලේ හා ඒ අවට වාස භූමි කරගත් බව පෙනේ. එසේ ම අදටත් ආදිවාසී ජනතාවගේ අනන්‍යතාවය තබා ගනිමින් ජීවත් වන ජන කාණ්ඩයම් මාතලේ හා මහනුවර දිස්ත්‍රික්කවල පර්යන්තයීය ප්‍රදේශවල ජීවත් වන අතර කිණිගම, ඕපල්ගල, කැකුලිවැටුණු ඇල්ල, වැද්දාපැණි ඇල්ල, දම්මන්තැන්න, ගලබොඩ, කරගහතැන්න, පුවක්පිටිය, පොත්තටවෙල, පිටිවෙල, ඇටන්වෙල, ඉමාඩුව, නාරංගමුව, එල්ලගල, ගල්ගෙදෙවාල, බලාපෙ, අත්කොටලියද්ද, යක්මොටේ, ඇඹුල්අඹේ, මීමුරේ, රණමුරේ ආදී ප්‍රදේශ මෙම ආදි වාසීන්ගේ පසුබිමකින් යුක්තව සම්භවය වූ බවට ජනශ්‍රැතික තොරතුරු තිබේ[42].

**කින්නර ජනතාව**

ශ්‍රී ලංකාවේ කුල සංවිධානය පදනම් කරගෙන බිහි වූ ඇතැම් කුල කණ්ඩායම් තවදුරටත් සුළු ජන කණ්ඩායම් වශයෙන් ජීවත් වන බව දැකිය හැකිය. විශේෂයෙන් වැඩවසම් පාලන ක්‍රමය තුළ කුලයට ආවේණික පාරම්පරික වෘත්තීන්හී නියැලුණු ඇතැම් කුලිකයින් අද්‍යතනය වන විටත් යම් යම් ප්‍රදේශවල අනන්‍ය ජීවන රටාවකට

---

[39] පී. බී. මීගස්කුඹුර, "විශේෂ ජන කොට්ඨාස," **මහවැලි වංශය**, II කාණ්ඩය, මහවැලි සංවර්ධන අමාත්‍යාංශය: ඉන්ජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය, 1985, පි. 20.
[40] රොබට් නොක්ස්, **එදා හෙළදිව**, අනු: ඩේවිඩ් කරුණාරත්න, කොළඹ: එම්. ඩී. ගුණසේන සහ සමාගම, 2011, පි. 219.
[41] ඔබේසේකර, **එම**, 2005, පි. 23.
[42] කමලා අතරගල්ල, "මාතලේ සහ කුරුණෑගල ආදිවාසි ගම්මාන," **ශ්‍රී ලංකාවේ ප්‍රාථමික ජනසමාජ**, ආදිවාසි ජන අධ්‍යයන කේන්ද්‍රය: ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය, කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ, 2009, පි. 38.

උරුමකම් කියමින් දිවි ගෙවති. පැරණි සමාජ සංවිධාන ක්‍රමය ඉතා ශීඝ්‍රයෙන් වෙනස්වීම කරන කොට ගෙන කුල වෘත්තීන් හා ඒවායේ ව්‍යුහාත්මකව ඇති වූ වෙනස්කම් වර්තමානය වන විට ඇතැම් කුල කණ්ඩායම්හි සුවිශේෂ අනන්‍යතාවන් පවා හඳුනාගත නොහැකි තරමට ම නවීකරණයට බඳුන් වී තිබේ. සමාජය නවීකරණය වීමත් සමඟ සමාජ සංවිධානයේ ඇති වූ වෙනස හා ආර්ථික ක්‍රමයෙහි පරිණාමීයභාවය තුළ බිහි වූ නව සමාජ සදාචාරය කුල වෘත්තීන්හී තිබූ අනම්‍යශීලීත්වයත් අනන්‍යතාවයත් යන ද්විත්වයම බිඳ හෙළනු ලැබීය. කෙසේ වෙතත් වෙනස් වන සමාජ පාරිසරික හා ආර්ථික තත්ත්වයන්හි පවා තවමත් ඇතැම් සාම්ප්‍රදායික කුල ක්‍රමයන් ඇසුරින් නිර්මාණය වූ සුවිශේෂී ජන කණ්ඩායම් තවමත් මැදරට ආශ්‍රිතව දිවි ගෙවන බව දැකගත හැකිය.

කින්නර ජනතාව හෙවත් නියඳ කර්මාන්ත කරුවෝ මෙම ජන කොටස් අතර එක් සුවිශේෂී කණ්ඩායමක් ලෙස ගැණිය හැකිය. මෙම කින්නර ජනයා උඩරට සිංහල සමාජ සංවිධානයේ කුල දූරාවලියට අනුව පහළ ම කුලයට අයත් වූවන් ය. "කින්නකාර යනු තෘණ කරුයි. පන්නකාර යන්න ද මේ සමාන අරුත් දක්වයි. මේ දෙකින් ම අදහස් වන්නේ නියඳ ගසේ කොළවලින් නොහොත් හණපතුවලින් විවීමයි."[43] මෙම ජන කණ්ඩායම කත්තකාර, පණ්ණකාර, කිණ්ණකාර, හේනාවලය, කින්නර යන නම් රාශියෙන් ම පැරණි සාහිත්‍යයෙහි හඳුන්වා දී තිබේ. රොඩීන් හැරුණු කොට කුල සංවිධානයේ පහළ ම කුලය ලෙස කින්නරයන් හැඳින්වුවත් නොක්ස්ගේ වාර්තාවන්ට අනුව කින්නර කුලයට පහළින් කුරුව්වෝ හා වහල්ලු සිටි බව සඳහන් කොට තිබේ. "කින්නර කුලයේ ප්‍රධාන කර්මාන්තය වනාහි කලාල නිෂ්පාදනය කිරීමයි. මේ කුලයේ පිරිමින් හට හිස් වැසුම් පැළඳීමත්, ස්ත්‍රීන් හට හැට්ට ඇඳීමත් තහනම් ය."[44] මොවුන්ගේ වෘත්තියට අදාළ වන්නේ හණපත් කපා පසුව ඒවායෙන් ලබාගන්නා නූල් විශේෂයෙන් විවිධ කර්මාන්ත කිරීම යි.

> "පැදුරු විවීමට භාවිත වන්නේ නියඳ කෙඳි යි. නියඳ පැළයේ පච්ච පැහැති වටකුරු කොළ (පිති) එකතු කොට, කඳක (නියඳ පෝරුව) තබා, සූරන තහඩුව වැනි දැවමුවා උපකරණයකින් සූරණු ලැබේ. මේ සීරීමෙන් නියඳ පිත්තේ මස් කොටස බැහැර යයි; කෙඳි ඉතිරි වෙයි. මේ කෙඳි තෙල් ගා පිරීමෙන් එවිටම වාගේ වැඩට ගැනීමට සුදුසු වෙයි." [45]

විවධ කර්මාන්ත හා කලාව ආශ්‍රිත වෘත්තීන්හි නියැළුණු ජන කණ්ඩායම් ඉන්දීය සම්භවයක් සහිත ජනතාවගෙන් පැවත එන්නන් බවට ඓතිහාසික තොරතුරු තිබේ. විශේෂයෙන් ධර්මදූතයන් ලෙසින් පැමිණි විවිධ කණ්ඩායම් හා ගජබාහු රජු ඉන්දියාව ආක්‍රමණය කිරීමෙන් පසු මෙරටට ගෙන ආ කණ්ඩායම්වලින් පැවත එන්නන් බවට සාක්ෂි සපයා ගත හැකිය. "මේ පුරාණය මාතලේ කඩයිම් පොතේ සඳහන් වනුයේ මේ අයුරින් ම මහනුවර රාජධානියේ ජනයා පදිංචි කරවූ බවත් මෙයින් 400 ක් හාරසිය පත්තුවේ ද 60 ක් හේවාහැට ද, 150 ක් තුම්පනේ ද, 12,000ක් ඌව පළාතේ ද, මහබල සේනාවක් මාතලේට ද යැවූ බව සඳහන් වේ."[46]

නමුත් කුමාරස්වාමි දක්වන්නේ කුඹලුන්, පෙහෙරුන්, පැදුරු වියන්නන් වැනි පහත් කාර්මිකයන් සිංහල ජන සංහතියෙහි නියම කොටසක් පිළිඹිඹු කරන බවයි. "ඇතැම් විට ඔවුන් සිංහලයන් එන්නට පළමුව මෙහි විසූ එහෙත් කිසිසේත් අශිෂ්ට නොවූ මනුෂ්‍ය වර්ගයාගේ ඉපැරණි සම්ප්‍රදායන් අනුගමනය කළා විය හැක."[47]

හණ නූලෙන් කළාල වියන කින්නරයන් සහ වේවැල්, බටපොතු ආදියෙන් කුළු, කුඩා, වට්ටි, පෙට්ටි ආදිය වියන කුළු පොත්තෝ ද සාම්ප්‍රදායික සමාජ සංවිධානයේ පහළ වෘත්තීන් වශයෙන් සලකා ඇත.[48] පාරිශුද්ධත්වය හා සමාජ සංවිධානයෙහි වෘත්තීය අන්තර්යැපීම මත පදනම් වන කුල ක්‍රමයෙහි කුමන හේතු නිසා මෙම කින්නර සහ බටපොත්තන් පහළ මට්ටමකට ගෙන ආවේදැයි පැහැදිලි නැත.

---

[43] මීගස්කුඹුර, **එම,** 1985, පි. 615.
[44] නොක්ස්, **එම,** 2011, පි. 236.
[45] ආනන්ද කුමාරස්වාමි, **මධ්‍යකාලීන සිංහල කලා,** කොළඹ: සංස්කෘතික දෙපාර්තමේන්තුව, 1962, පි. 241.
[46] ඔබේසේකර, **එම,** 2005, පි, 25.
[47] කුමාරස්වාමි, **එම,** 1962, පි. 62.
[48] නොක්ස්, **එම,** 2011, පි. 236.

"හන්නාලියෝ, පනික්කියෝ, බඩහැලයෝ, හේනයෝ, හකුරු, බෙරවායෝ හා කින්නරයෝ සියළුම දෙනා හීන කුලවලට හෙවත් අඩු කුලවලට අයත් වූහ. එහෙත් ඔවුන් විසින් ඉටු කළයුතු වූ කාර්යයන් "වැදගත් මිනිසුන්" කිසිම විටක නොකළ හීන දීන සේවා නොවිණි."[49]

කෙසේ වුවත් මෙම නියඳ කර්මාන්තකරුවන් සුවිශේෂී වූ ප්‍රදේශ ආශ්‍රිතව තමන්ගේ වෘත්තීන් සිදු කළ බව මූලාශ්‍රයන් ඔස්සේ පැහැදිලි කරගත හැකිය.

මේ ජන කොටස පදිංචි පාතදුම්බර, හේනාවල සහ මාතලේ මල්ලෑව යන ප්‍රදේශ ඉතා සුප්‍රසිද්ධ ය. විශේෂයෙන් හේනාවල කින්නර ජනතාව නියඳ විවීම ඉතා දීර්ඝ කාලයක් තිස්සේ වෘත්තිමය වශයෙන් සිදු කොට ඇත. කින්නර ජනයා හැඳින්වීම සඳහා හේනාවලය යන නම භාවිත වන්නේ ද හේනාවල වාසය කළ කින්නර ජනයා හේතුවෙන් බව සිතිය හැකිය. මීට අමතරව මහනුවර මැණික්හින්න, හුරියකඩුව යන ප්‍රදේශවලත් කින්නර ජනයා පැතිරී සිටි බවට සාක්ෂි තිබේ.[50]

මෙම ජන කොටස ඉතා සුළු ජන කණ්ඩායමක් වූ අතර ඩේවි හා නොක්ස්ගේ මූලාශ්‍රයන්වල පවා ඔවුහු කින්නර බද්ද ඉතා කුඩා කුල කණ්ඩායමක් වශයෙන් හඳුන්වා දී ඇත. පැරණි කින්නර බද්දට අනුව රාජකාරිය වූයේ රාජකීය ගබඩාවලට කඹ, පැදුරු, චාමර හා කස සැපයීමයි.

"මෙම කුලයේ පැරණි පුරුෂ නාම අතර වස්තුවා, ලපයා, කින්හපුවා, මුත්තුවා, පුංචා, පිනා, හවඩියා, යන නාමයන් හා ස්ත්‍රී නාම ලෙස කිරී, උක්කුන්, ලපී, පිංචිනා, ඩිංගිරි හපු, පුංචිනා යන නම් භාවිත කළ අතර බයියා දුරයලාගේ ගෙදර, හාරිස්පත්තුවේ ගෙදර, තෙළඹු තැන්නේ ගෙදර, බටගල්ලේ ගෙදර, සේරුගස් වත්තේ ගෙදර, හීන්කෝට්ටේ ගෙදර, බට්ටිලාගේ තැන්නේ ගෙදර, පන්සල් වත්තේ කින්නර ගෙදර ආදී වාසගම් කින්නර ප්‍රජාවගේ වාසගම් අතර වන බව දැකිය හැකි ය"[51]

හැවන් පන්, ගල්ලෑහැ හා හණ කෙඳිවලින් නිර්මාණය කරන දුම්බර පැදුරු හා කලාලයන් අදටත් සුප්‍රසිද්ධ ය. මාතලේ දිස්ත්‍රික්කයේ අස්ගිරි පල්ලෙසියපත්තුවට අයත් මල්ලෑව (1981 දී උදාගම් යටතේ ආලෝකගම බවට පත්විය) අදටත් දුම්බර පැදුරු කර්මාන්තය සඳහා ප්‍රසිද්ධ ය. කින්නර ජනයා පැදුරු හා කලාල කර්මාන්තය මනා පුහුණුවකින් යුක්තව සිදු කරන අතර රතු, කහ, කළු යන වර්ණ ස්වාභාවික පරිසරය ඔස්සේම ලබා ගනිමින් විවධ ආවේණික රටා ද භාවිත කරමින් මෙම කර්මාන්තයෙහි නියුක්ත විය. "කින්නර ගීතයෙහි" ඔවුහු ඉහත වර්ණ නිර්මාණය කරගත් අයුරු පහත දැක්වෙන කවියෙන් මනාව පැහැදිලි වේ.

පතගි ද සීනක්කාරම් සමඟින

නියඳ කරන් රතු කොරකහ කොළ ගෙන

කහ පැහැ වන්නේ වෙනිවැල් ගත්තැන

අරළු ද බුළු ගත කළු පැහැ පැමිණෙන[52]

එසේම ඉතා විසිතුරු රටාවන් නියඳ විවීමට යොදාගත් කින්නරයන් ඒවා කාලාන්තරයක් තිස්සේ හෙළ සංස්කෘතික උරුමයන් ලෙසින් පරම්පරාවෙන් පරම්පරාවට පවත්වාගෙන පැමිණියහ. ලණු ගැටය, වංග ගිරිය, භයංකාර, තාරකා පියුම්, හරස් රටාව, ඉද්දමල් පියුම් හෙවත් කතුරු මල්, දිය රැළ, අටපෙති මල, මල්පෙත්ත, ගල් පියුම්, සෙව්වණ්ඩි හෙවත් සමුද්‍රාමල, කිරිබත් රටාව ඒ අතර ප්‍රමුඛයෝ වෙති.

[49] රැල්ෆ් පීරිස්, **මධ්‍යකාලීන සිංහල සමාජ සංවිධානය,** බොරලැස්ගමුව: විසිදුණු ප්‍රකාශකයෝ, 1964, පි. 188.
[50] උල්ලුවිස් හේවා, **උඩරට සංස්කෘතික අභිමානය,** කොලඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ, 2008, පි. 170.
[51] විමලනාත් වීරරත්න, "දුම්බර රටා මැවූ කින්නර පරපුර," **ජන විවිධත්වය,** රාවය ප්‍රකාශනයක්, 2007, පිටු. 85-94.
[52] කුමාරස්වාමි, **එම,** 1962, පි. 244.

නමුත් වර්තමානය වන විට නවීකරණය සමඟ මෙම ප්‍රජාව වෘත්තීමය වශයෙන් හා සමාජමය වශයෙන් දැඩි ආන්තිකරණයකට ලක්වී සිටින අතර කුල පීඩනයත් අනෙක් අතට තමන්ගේ කර්මාන්තයට එල්ල වී ඇති අභියෝගයනුත් හමුවේ අසරණභාවයට පත්වී ඇත. කෘත්‍රිම නිෂ්පාදනයන් ඇති වීමත් ස්වාභාවික අමුද්‍රව්‍ය සපයා ගැනීමේ දුෂ්කර බව හා ඒවාට ඉහළ මිලක් ගෙවීමට සිදු වීමත් වෙළෙඳපළ උච්ඡාවචනයන්ට මුහුණ දීමට සිදු වීමත් වැනි කරුණු හේතුවෙන් මෙම ජනයා වෘත්තීමය වශයෙන් පීඩිතභාවයකට පත් වී ඇත. එසේ වුව ද පැරණි සංස්කෘතික උරුමයන් විදහා දක්වන නියඳ රටාවන් වියමින් මෙම කණ්ඩායම ස්වකීය අනන්‍යතාවය යම්තාක් දුරකට හෝ තබා ගනිමින් දිවි ගෙවති.

**රොඩී ජනතාව**

'රොඩී' හෙවත් 'ගාඩි' ජනයා ද අප ඉහත සාකච්ඡා කළ පරිදි සාම්ප්‍රදායික කුල ක්‍රමය පදනම් කර ගනිමින් නිර්මාණය වූ ජන කොටසකි. මෙම ප්‍රජාව උඩරට කුල සංවිධානයේ ඉතාම පහළ කුලය නියෝජනය කළේ ය. එසේ වුව ද වැඩවසම් ක්‍රමය අනුව ඔවුන් ද සමස්ත සමාජාර්ථ ක්‍රමයෙහි යම් කෘත්‍යයක් ඉටුකළ බව පෙනෙන්නට තිබේ. "මොවුහු වෘත්තීය යාචකයෝ හා විජ්ජාකාරයෝ වූහ. රොඩී මිනිස්සු පවා අලින් ඇල්ලීම සඳහා ස්වභාවික හේතූන් උඩ මියගිය හරකුන්ගේ සම්වලින් ඇඹරූ යොත් රාජකීය ගබඩාවට සැපයූහ." මෙම ජන කණ්ඩායම ප්‍රධාන සමාජයෙන් අපහරණය කරන ලද ජන කොටසක් වූ අතර ඉතාම පහත් සමාජාර්ථික තත්ත්වයකින් යුක්තව ජීවත්වන ප්‍රජාවක් ලෙස සැලකිය හැකිය. විශේෂයෙන් ඉතාම පහත් කණ්ඩායමක් ලෙස සමාජ අවමානයට පාත්‍රවීම රොඩී ප්‍රජාව ලබා ඇති දුක්ඛිතම තත්ත්වයයි.

රොඩී ජනතාව උඩරට කුල ක්‍රමයේ නිශ්චිත වූ ආරෝපිත කුල තත්ත්වයකට වඩා විවිධ සමාජ අපගාමී චර්යාවල නියුක්ත වූවන්, අපරාධකරුවන්, කුල හා වංශ කණ්ඩායම් අතර චාරිත්‍ර හා නීති කඩකළ වූවන් තත්ත්වයෙන් පහත හෙළන ලදුව රඳවා තැබූ 'සමාජ බන්ධනාගාරයක්' ලෙස සැලකිය හැකිය. නැතහොත් සමකුල නීති කැඩූවන්ට හා විවිධ අපරාධකරුවන්ට දෙනු ලැබූ දඬුවමක් ලෙස රොඩී සමූහයට පිටමන් කිරීම සිදු කරන ලදී. දඬුවම්වල ස්වභාවය අනුව ගත් විට උඩරට සමාජ සංවිධානයේ දැකිය හැකි කෲරම දඬුවම ලෙස "රොඩී රැහැට පාවා දීම" සිදු කරන ලදී. එය අංගච්ඡේදනය කොට මරණීය දණ්ඩනයට පත් කිරීමට වඩා සාහසික බව ඇතැමුන් විසින් දක්වා තිබේ. "පුරාණ සිරිත්වලට අනුව රජු පමණක් පැනවිය යුතු දඬුවම් විශේෂයක් ඇත. එනම් උසස් කුලවලට අයත් පුද්ගලයින් මනුෂ්‍ය වර්ගය අතර ඉතාම අධම හා පිළිකුල් කටයුතු මිනිසුන් ලෙස සැලකෙන රොඩී කුලයට අයත් කරවීමයි. එබඳු දඬුවමකින් ඇති වන අපකීර්තිය හා සම අනෙකක් නැති අතර එය කිසිදාකවත් ආපසු හැරවීමට ද නොහැකිය. මේ දඬුවම පමුණුවනු ලබන්නේ ඉතාම සෝර වැරදි සඳහාම පමණි."[53]

> "නොයෙක් අවස්ථාවලදී රජු අධිපතියන්ගේ හිස් ගසාදමා ඔවුන්ගේ අඹු දරුවන් රොඩී රැහැට පවා දෙති. එය වනාහී මරණ දණ්ඩනයට පත් කිරීමට හිස ගසා දැමීමට වඩා දරුණු වූ දඬුවමක් ලෙස සලකනු ලබන්නේ එම දඬුවම ලබන්නවුන් මුළු මහත් ජීවිත කාලය ම හිඟාකමින් ජීවත් විය යුතු බැවිණි."[54]

මේ සම්බන්ධයෙන් අදහස් දක්වන නොක්ස් තවදුරටත් පෙන්වා දෙන්නේ රොඩී රැහැට එළවීම සඳහා තීරණය ගෙන ඇති විටෙක යමෙකුට රජුගෙන් අනුකම්පාවක් අයැද සිටිය හැකි අතර එහි දී ජලාශයක් වෙත ඔහු ගෙන ගොස් ඊට පැන මිය යන්නට අවස්ථාව ලබාදෙන බවයි. රොඩී රැහැට යැමට වඩා දියේ ගිලී මිය යැම වඩා සැපතක් ලෙස සැලකීම එම යුගයේ පැවති තත්ත්වයක් බව මේ අනුව පෙනේ. මෙම ජන කොටස සමාජයීය වශයෙන් කෙතරම් පහත් මට්ටමකට පත්කර ඇත්තේදැයි යන්න ඉහත ප්‍රකාශනයන්ගෙන් ගම්‍ය වෙයි. මෙය තවදුරටත් පැහැදිලි කෙරෙන ප්‍රකාශයක් ඩොයිලිගේ වාර්තාවේ සඳහන් වේ.

---

[53] ජෝන් ඩොයිලි, **ඩොයිලි දුටු උඩරට රාජ්‍යය,** පරි: උපාලි රත්නායක, කොළඹ: ෆාස්ට් පබ්ලිෂන්, 2011, පි. 125.
[54] නොක්ස්, **එම,** 2011, පි. 239.

> "1818 දී හුරීකඩුව ගමේ සිදුවූ මිණී මැරුමකට වැරදි කරුවන් වූ රොඩී මිනිසුන් දෙදෙනෙකු හා වෙල්ලාල මිනිසෙකු මහනුවර පිහිටි "මහ හිරගේ" තුළ එල්ලා මැරීමට නියම විය. රැකවල්ලුන් විසින් වෙල්ලාල මිනිසා එල්ලා මැරුව ද රොඩියන් මැරීම ප්‍රතික්ෂේප කළ බැවින් අසල වූ ගුබ්බෑයමක විසූ රොඩී කුලේ පිරිසක් කැඳවා ඔවුහු අළුගෝසුවන් ලෙස යොදාගත්හ."[55]

රොඩීන්, සැඩොල්, චණ්ඩාල, වසල වැනි නම්වලින් ඔවුහු හඳුන් වන අතර රොඩීන් විසින් ම ඔවුන් හඳුන්වා ගනු ලබන්නේ 'ගාඩි' හෝ 'ගැඩි' යන නමිනි. දෙමළු ඔවුන් "ලුද්දි" නමින් හඳුන්වති.[56] මෙම රොඩී ජනතාව ආරම්භ වූ ආකාරය පිළිබඳ විවිධ ජනප්‍රවාදයන් ජනශ්‍රැතියේ ඇත. රොබට් නොක්ස් විසින් දක්වන ලද ජනප්‍රවාදය පහත පරිදි ය.

> "අතීතයෙහි මෙම රොඩී ජනයාගේ මුතුන් මිත්තෝ මහරජුට දඩමස් සපයන මස් වැද්දෝ වූහ. දඩමස් නොලැබුණු එක්තරා දවසක ඔවුහු දඩමස් වෙනුවට මිනීමස් ගෙනවුත් දුන්නෝය. රජ්ජුරුවන් හට ඒ මස රස වැටී (ඒ මස් මිනීමස් බව නොදැන) එම මස් ම ගෙන එන ලෙස ඔවුන් හට නියම කළේය. රජුගේ කපුවාට ඒ මසෙහි රහස දැනගන්නට ලැබිණ. හෙතෙම ඒ බව රජතුමාට රහසේ ම කීවේය. මෙය දැනගත් රජ තෙමේ මහත් වූ කෝපයට පැමිණ "මරණ දණ්ඩනය වූ කලී වරද කරුවන් හට පමුණුවන දණ්ඩනය ය. මොවුන් මට කළ නින්දාවට එම දඬුවම ප්‍රමාණවත් නොවේ යැයි කල්පනා කොට මෙසේ අණක් පැනවීය" මස් වැදි ගණයට අයත් හැම කෙනෙක් ම ගමෙන් බැහැරව ගොස් වාසය කළ යුතුය. කිසිම මංගල උත්සවයකට හෝ සෙසු කිසිම උත්සවයකට නොපැමිණිය යුතුය. තව ද ඔවුන්ගේ ජීවිකාව පිණිස ඔවුන් විසින් කිසි වැඩක් නොකළ යුතුය. ජීවිකාව පිණිස හැම කෙනෙක් ම ගෙයක් ගෙයක් පාසා සිඟා කෑ යුතුය. හැම රට වැසියෙකුගේම පිළිකුලට හා ජුගුප්සාවට පාත්‍රවිය යුතුය."[57]

මෙම රාජ ආඥාවෙන් පසු ඔවුහු ජන සමාජයෙන් පළවා හැරි අතර ළිඳකින් දිය බිඳක් හෝ බීමට අවසර නැති අතර දිය වළකින් හෝ ගඟකින් දිය බීම කළයුතු බවත් රොඩියෙකුට යමක් නොදී සිටීම පවා රටවැසියන්ට මහත් මදිකමක් ලෙස සැලකූ බව පෙනෙන්නට තිබේ.

රොඩීන්ගේ ආරම්භය පිළිබඳ මෙවැනි ජනප්‍රවාද රාශියක් විවිධ දේශාටන වාර්ථා හා ලේඛකයින්ගේ ශාස්ත්‍රීය රචනයන් හි අන්තර්ගතව ඇත. රොඩී ප්‍රජාව විසින් ජීවනෝපාය සඳහා සිදු කරන විවිධ කර්තව්‍යයන්හි සුලමුල පිළිබඳව ද නොක්ස්ගේ සටහන් තුළ තිබේ.

> "මෙම කුලයේ සිත්‍රීන් සිඟා කෑමට ගම්මානයකට පැමිණි කල්හි පිරිසේ පිරිමින් බෙර ගසද්දී ගැහැනු නටන්නාහ. විජ්ජා පෙන්නන්නාහ. ඇඟිලි තුඩු අග රඳවා රබන් කරකැවීමෙහි ඔවුහු අතිශයින් සමර්ථයහ. බෝල නවයක් උඩලා නිතරම බෝල 07 ක් උඩ තිබෙන පරිදි වහ වහා අල්ලති. වර්ණ කිහිපයකින් යුත් පබලු ඇට ගෙන කටෙ දමාගෙන ඉක්බිති ඒ නොයෙක් වර්ණවලින් යුත් පබලු ඇට එකම වර්ණවත් ඇට බවට පත් කොට කටින් එළියට දැමීම ඔවුන් විසින් කරනු ලබන එක් විජ්ජාවකි."[58]

රොඩීන් සංචාරක ප්‍රජාවක් වුව ද උඩරට රාජධානියෙහි ඔවුනට ගම්වර ලබාදුන් බව ද දක්නට තිබේ. දුම්බර ප්‍රදේශයේ කුරගන්දෙණියේ ලාස් 16 ක වපසරියක් සහිත කුඹුරු ඉඩමක් ද, කුරක්කන් වැපිරීම සඳහා ලාස් 12 ක උස් බිමක් ද ඇති බවත්, හාරිස්පත්තුවේ කොස්කොටේ ගමෙහි ලාස් 15 ක කුඹුරු ඉඩමක් ද, ලාස් 8 ක උස් බිමක් ද, යටිනුවර ප්‍රදේශයේ උඩුගල් පිටියේත්, මාතලේ ප්‍රදේශයේ කිරිඔරුව සහ මරුකොන යන ගම්මානවලත් වලපනේත් මෙසේ රජු විසින් ප්‍රධානය කළ ඉඩම් පැවති බව ඩොයිලි දක්වයි. පසු කාලය වන විටත් මහනුවර

---

[55] ඩොයිලි, **එම,** 2011, පි. 12.
[56] මීගස්කුඹුර, **එම,** 1985, පි, 617.
[57] නොක්ස්, **එම,** 2011, පි. 238.
[58] නොක්ස්, **එම,** 2011, පි. 238.

දිස්ත්‍රික්කයේ කුරගල, උඩුගල්පිටිය, කුරහන්දෙණිය හා කොස්කාටේත් මාතලේ දිස්ත්‍රික්කයේ කළල්පිටිය හා හිරුවෙලත් නුවරඑළිය දිස්ත්‍රික්කයේ එගොඩකන්ද හා කළුගල් පතන ප්‍රදේශවලත් මෙම ජනයා විසිරී සිටින බව දැකිය හැකිය.[59] මෙසේ පැවති වාඩි හා කුප්පායම් කාලයත් සමඟ ඉවත් වී ගිය අතර අදවන විට මෙම රොඩී ජනයා ලෙස හඳුනාගත හැකි පිරිස් ඇත්තේ අතළොස්සකි. ඉන් සමහරෙක් ජංගම ජීවිතයක් ගත කරන අතර ජලාශ හා ගංගා ආශ්‍රිත ආන්තික භූමි හෝ නගරාසන්න ආන්තික ප්‍රදේශවල තරමක් දුරට දැකගත හැකිය.

මෙම ප්‍රජාව සහ අනන්‍ය සංස්කෘතිය ක්‍රමිකව ගිලිහී ගිය අතර ඊට හේතු කිහිපයක් බලපෑවේ ය. උඩරට රාජධානියෙහි මහනුවර යුගය වන විට මෙම ජනතාවට විශාල වශයෙන් තාඩන පීඩන එල්ල වූ අතර ඇතැම් රොඩී ගම්මාන සමූල ඝාතනය කිරීම හා සිරගත කිරීම සිදු කරන ලදී. ඊට එක් හේතුවක් වූයේ ඇතැම් රොඩී පිරිස් කුලකාන්තාවන්ට හිරිහැර කිරීම, මං පැහැරීම හෝ සොරකම වැනි අපරාධකාරී ක්‍රියාවන්හි නියුක්ත වීමයි. ඩොයිලි වාර්තා කරන අන්දමට වැරදි කළ රොඩීන් දඬුකඳේ ගසා අලි ඇතුන් එන මාර්ගයන්හි රඳවා අලින් විසින් පාගවා මරණයට පත් කළ අතර ඇතැම් වැරදිවලට රොඩී ගම්මාන ගිනි තබන ලදී. ඌවෙහි දිසාවේ වශයෙන් අංගම්මන කටයුතු කළ සමයෙහි කුල කාන්තාවක් පැහැර ගැනීම සම්බන්ධයෙන් පරණගම රොඩී ගම්මානයම ගිනි තබා විනාශ කළ බව දක්වා ඇත. එසේ ම 1829 දී අධිකරණ කොමසාරිස් ජේ. ඩවුනින් මහතා උඩුනුවර, යටිනුවර, උඩ පළාත හා හතර කෝරළේ විසූ රොඩී පිරිමින් හා ගැහැනුන් මහනුවර බන්ධනාගාරයේ රඳවා තබන ලෙස නියෝග කළ අතර ඊට හේතු වූයේ සමහර රොඩී මිනිසුන් රටේ මිනිසුන් බිය ගන්වන බවටත් ඔවුන්ට අපහාස කරන බවටත් ලද පැමිණිල්ලක් අනුව ය.[60] තව ද සමාජ නවීකරණයත් සමඟ සිදු වූ කුලය ලෞකික වීම සහ අනන්‍යතාව බැහැර වීම මෙම කණ්ඩායම්වල අනන්‍යතාව නැති වී සම්මිශ්‍රිත සංස්කෘතික කණ්ඩායමක් බවට පත් වීමට ද රොඩී ජනයා සමාජ සංස්කෘතික වශයෙන් ක්‍රමික තුරන් වීමකට ලක්වීමට ද හේතු සාධක විය.

**පෘතුගීසි සිංහලයෝ**

මැදරට අනු ජන කණ්ඩායම් පිළිබඳව සාකච්ඡා කරන විට මාතලේ දිස්ත්‍රික්කයට අයත් වහකෝට්ටේ වාසය කරන "දොන්" නමින් හඳුන් වන ජන කොටස ඉතා වැදගත් වේ. "පෘතුගීසි සිංහලයින්" ලෙස සැලකෙන මෙම ප්‍රජාව කතෝලික බැතිමතුන් වෙති. වසර 500 කටත් වඩා වැඩි සංස්කෘතික අනන්‍යතාවක් සහිත මෙම ජන කොටස පෘතුගීසි හා සිංහල සම්මිශ්‍රිත ජන කොටසක් ලෙස හඳුනාගත හැකියි. "සිංහල රජවරුන් විසින් ගෙනවුත් පදිංචි කරන ලද පහත රටට අයත් යුධ සිරකරුවන්ගෙන් පැවත එන අය යැයි ද අනුමාන කරනු ලැබේ."[61]

දෙවන රාජසිංහ රජු ලන්දේසි සටනින් පරාජයට පත් වී රැකවරණය පතා එන පෘතුගීසීන්ට ආරක්ෂාව ලබාදුන් බව සඳහන් වන අතරම රජුගේ යුධ හමුදාවේ ඇතැම් සෙන්පතියන් ලෙස පෘතුගීසි සේනාංකවල සේවය කරන ලද භටයන් සිටි බව ද දැක්වේ.[62] මේ අනුව කන්ද උඩරට පෘතුගීසි කණ්ඩායම් රජුගේ අනුදැනුම හා අනුග්‍රහය පිටම රැඳී සිටි බව හෙළිවන අතර පළමුවන විමලධර්මසූරිය රජු (1594-1604) සෙනරත් රජු (1604-1636) හා දෙවන රාජසිංහ රජු (1636-1687) යුද්ධයේදී යටත් වූ හා ජීවිත බේරා ගැනීම සඳහා මැද රටට පලා ආ පෘතුගීසි ජාතිකයින්ට මහනුවර රාජධානිය තුළ වාසය කිරීමට අවසර ලබාදුන් බව සඳහන් වේ.

මැද රටට පැමිණි පෘතුගීසි ජනයාට මූලික කොන්දේසි තුනක් පැන වූ අතර ඒවා නම් මහනුවර රාජධානිය තුළ වාසය කිරීම, සිංහල කුලකතුන් විවාහ කර ගැනීම හා සිංහල කාන්තාවන්ගේ වාසගම තම වාසගම ලෙස ඉදිරියට ගෙනයාමත් ය. ඒ අනුව තුම්පනේ, අස්ගිරිය, මාත්ගමුව, පිටියේ ගෙදර, දුල්ලෑව, බෝවත්ත, මීරිහල්ල

---

[59] මීගස්කුඹුර, **එම,** 1985, පි. 616.
[60] ඩොයිලි, **එම,** 2011, පිට 163.
[61] මීගස්කුඹුර, **එම,** 1985, පි. 624.
[62] නොක්ස්, **එම,** 2011, පි. 200.

ආදී ප්‍රදේශවල රජුගේ නියමය පරිදි පදිංචි වූ පෘතුගීසීහු වෙල්ලාල හා පට්ටි කුලවලට අයත් කාන්තාවන් සමඟ විවාහ වූහ.[63] ආගම ඇදහීම පිළිබඳ කිසිදු තහංචියක් රජු විසින් පැන නොවූ බැවින් ඔවුහු කතෝලික භක්තිකයන් වූහ. මාතලේ දිසාවට අයත් උඩුගොඩ පල්ලේසිය කොට්ඨාසයේ හත් කෝරළයටත් මාතලේටත් අතර පිහිටා ඇති වහ කෝට්ටේ ජීවත් වන 'පෘතුගීසි සිංහල' හෙවත් 'දොන්' ජන කොටස ඉහත දැක් වූ පරිදි පෘතුගීසි හා සිංහල සම්මිශ්‍රිත ජන කොටසක් ලෙස පැවත එන්නෝය. පිය පාර්ශ්වය යුරෝපීය වන අතරම මව් පාර්ශ්වයෙන් උඩරට සිංහල පෙළපත්වලට ඔවුහු අයත් වෙති. ජාතිය සිංහල ලෙස සඳහන් වන මෙම ප්‍රජාවේ නම් මව් පාර්ශ්වීය පෙළපත්වලින් ලැබුණු ඒවා වෙති. "1658 දී වහකෝට්ටේ ග්‍රාමයට මුලින් ම පැමිණි පෘතුගීසි ජාතිකයින් කිහිප දෙනා පදිංචිව සිටි "මහගම" නැමති ස්ථානයේ ස්මාරකයන් ඇත. ශුද්ධ භූමියක් ලෙස සැලකුම් ලබන මෙම පෙදෙස අද හඳුන්වන්නේ ජුසේවාස් පෙදෙස නමිණි."[64]

වහකෝට්ටේ ශාන්ත අන්තෝනී දේවස්ථානය 1838 දී ඉදිකරන ලද අතර එය අදටත් ඉතා සුප්‍රසිද්ධ දේවස්ථානයක් ලෙස සැලකිය හැකිය. ඊට ප්‍රධානම හේතුව වන්නේ මෙම පල්ලියේ දේව මංගල්‍යයේ දී උඩරට නැටුම් හා පංචතූර්ය වාදනය මෙම ආගමික උළෙල සඳහා යොදා ගැනීම යි. මෙය වෙනත් කිසිඳු කතෝලික පල්ලියක දැකිය නොහැකි අතර බොහෝ විට මෙම ප්‍රජාවේ පවතින ජන සම්මිශ්‍රිතභාවය සංස්කෘතික සම්මිශ්‍රණය ඊට සෘජුවම හේතු වන්නට ඇතැයි සිතිය හැකිය.

> "1687 දී මෙරටට පැමිණි ජුසේවාස් පියනම හා 1705 දී පැමිණි ජාකෝවේ ගොන්සාල්වේස් පිය නම වහකෝට්ටේ ආගමික කටයුතුවල ප්‍රමුඛව නියැළී ඇති අතර පසන් ලතෝනි ගායනා පොත හා දේශනා පොත සිංහල බසින් රචනා කොට ඇත්තේ ද ගොන්සාල්වේස් පියතුමා විසිනි."[65]

තුම්පනේ ගෙදර, මාත්ගමුවේ ගෙදර, මිරිහල්ලේ ගෙදර, බෝවත්තේ ගෙදර, අස්ගිරියේ ගෙදර, මැටියම්පත ගෙදර, දුල්ලෑවේ ගෙදර ආදී වාසගම් වහකෝට්ටේ ජනයා භාවිත කරන අතර මේවා බොහෝමයක් ඉහත සාකච්ඡා කළ පරිදි උඩරට රජු විසින් ඔවුන් පදිංචි කරවන ලද ප්‍රදේශ ආශ්‍රිතව විවාහයන්ගෙන් පසුව ලැබුණු සිංහල නාමයෝ වෙති. ඔවුහු කතෝලික අනන්‍යතාව හැඟවීම සඳහා පෘතුගීසි නමක් ද බොහෝ විට භාවිත කරන අතර "දොන්" නාමය අනන්‍යතාවක් ලෙස භාවිත කරති.

මෙම ප්‍රජාවේ බොහෝ සංස්කෘතික ක්‍රියාකාරකම් පෘතුගීසි හා සිංහල සම්මිශ්‍රිත ස්වභාවයක් ගන්නා අතර ඒවා වැඩි වශයෙන් සිංහල සංස්කෘතියට නැඹුරු වූ සුවිශේෂී අනන්‍යතාවක් සහිත බව පෙනෙන්නට තිබේ. වීරරත්න (2007) දක්වන පරිදි ඔවුන්ගේ විවාහ මංගල උත්සව අවස්ථාවන්හි දී දැකිය හැකි චාරිත්‍ර කිහිපයක් පහත දැක්වේ.

> කඩ වැසුම:- විවාහයට පෙර මනාලයා පළමුවෙන් කරන්නේ කඩවැසුම් කිරීමයි. එනම් තම දෙමාපියන් සමඟ ගොස් විවහාපේක්ෂිත තරුණියගේ ගෙලෙහි කර මාලයක් බැඳීමයි. කඩවැසුමෙහි සාමාන්‍ය අදහස කට වැසුම ය. ඉන් පසු වෙනත් තරුණයෙකුට මනමාලියට බහක් දිය නොහැකිවීම ඊට හේතුවයි. අනතුරුව පල්ලියේ තෙවතාවක් පෙරනම් කියනු ලැබේ. විවාහයට ගමෙහි විරෝධතා ඇත්නම් මෙම කාලය තුළ එම විරෝධතා ඉදිරිපත් කළ හැකිය.
>
> මඟුල් පරක්කුව:- මනාලියගේ නිවසට එන මනාලයා ප්‍රමුඛ පාර්ශ්වයට උත්සව කටයුතු ඇරඹෙන තුරු තේරවිලි හා ගණිත ගැටලු විසඳීමට දීම මෙනමින් හැඳින් වේ. නූලක

[63] විමලනාත් වීරරත්න, "වහකෝට්ටේ පෘතුගීසි සිංහලයෝ," **ජන විවිධත්වය,** රාවය ප්‍රකාශනයක්, 2007, පිටු. 75-84.
[64] **එම**, පි. 77.
[65] වීරරත්න, **එම,** 2007, පි. 80.

එකපිට ගැසූ ගැට ලිහීමට දීම, පලා වර්ග කිහිපයක් එක්කොට පිසූ මැල්ලුමක රස බලා පලා වර්ග හඳුනා ගැනීම ආදිය මීට අයත් වේ.

මනාලිය සැඟවීමඃ- පල්ලියේ විවාහ කටයුතු සිදු කිරීමෙන් පසු මනාලිය දෙමාපියන් විසින් නිවසට කැඳවාගෙන එන අතර ඇය තවත් තරුණියන් හතර පස් දෙනෙකු සමඟ කළුවර කාමරයකට දමන අතර මනාලයා පෙරකී කාමරයට ගොස් තම මනාලිය තෝරාගෙන මධුසමයට පිටත් විය යුතුය.

බත් කද හා කැවුම් කදඃ- මනාලියගේ දෙමව්පියන් දින තුකට පසු තම දියණිය බැලීමට පැමිණෙන විට බත් මාළු පිණි කදක් හා කැවුම් කුරුණියක් සමඟ කෙසෙල් කැන් කිහිපයක් කද බැදගෙන පැමිණිය යුතුය. [66]

මෙම ජනකොටස අතර අන්තර්ජන්‍ය විවාහ ක්‍රමය හෙවත් තම ගෝත්‍රය හෝ කණ්ඩායම තුළින් විවාහ වීමේ ක්‍රමය පවතින අතර ඉහත චාරිත්‍රයන්ට අනුව උඩරට සිංහල විවාහයේ දී අනුගමනය කරන මඟුල් තහංචි, කඩුළු බුලත් දීම වැනි චාරිත්‍රයන්ට සමාන නමුත් ඔවුනට සුවිශේෂී ලෙස සකසාගත් අනන්‍යතාවකින් යුත් චාරිත්‍ර වශයෙන් හඳුනාගත හැකිය. මෙම චාරිත්‍ර බොහෝවිට ඔවුන්ගේ සුවිශේෂී වූ උප සංස්කෘතික අනන්‍යතාව රැකගන්නා පරිදි නිර්මිත ය.

**වතු ද්‍රවිඩ ජනතාව**

මැදරට කලාපයේ සංස්කෘතික අනන්‍යතාව හා අනුජන කණ්ඩායම් පිළිබඳව සාකච්ඡා කරන විට උඩරට වතු ද්‍රවිඩ හෙවත් ඉන්දීය දෙමළ ජන කණ්ඩායම පිළිබඳව සාකච්ඡා කළ යුතුම ය. දැනට ශ්‍රී ලංකාවේ සමස්ත ජනගහණයෙන් 5% කට වඩා නියෝජනය කරන මෙම ජන කොටසේ ඉතිහාසය බ්‍රිතාන්‍ය යටත්විජිත සමයේ ආරම්භ වූ වාණිජ වතුභෝග වගාවත් සමඟ සිදු විය. උඩරට සිංහල ජනයා ඉංග්‍රීසීන්ගේ වැවිලි භෝග වගාවට ශ්‍රමය සැපයීමෙන් වැළකී සිටිය හ. ඊට එක් හේතුවක් වූයේ මේ වන විටත් ක්‍රියාත්මක වූ රාජකාරි ක්‍රමයයි.

> "1832 දී ලිබරල් චින්තනයේ හා මානව දයාන්විත භාවයේ මුවාවෙන් කෝල්බෲක් කොමසාරිස්වරු මෙය අහෝසි කළහ. එහෙත් ඇත්ත වශයෙන් ම මෙම සමාජ සංවිධානය වෙනස් කරන ලද්දේ මානව හිතවාදයට වඩා වැවිළි භෝග වගාවේ අභිවෘද්ධිය සඳහා කන්ද උඩරට ප්‍රදේශය තුළින් ලාභ ශ්‍රමයක් ඉතාම පහසුවෙන් ලබා ගැනීමේ චේතනාව පෙරදැරි කරගෙන යි." [67]

නමුත් උඩරට සිංහල ජනයා වතු වගාවට ශ්‍රමය සැපයීමට රුචි නොකළ අතර ඇතැමුන් එය තරයේ ප්‍රතික්ෂේප කළහ. විවිධ ඉඩම් ප්‍රතිසංස්කරණ තුළින් උඩරට ජනායාගේ ම ඉඩම් විශාල ප්‍රමාණයක් වතු භෝග වගාවට භාවිත කිරීමත් මේ වන විට ක්‍රියාත්මක වෙමින් පැවති අධිරාජ්‍ය විරෝධී ජාතික චින්තනය පෙරටු කොටගත් විඥානයත් ඊට බොහෝ විට හේතු වන්නට ඇත. ශ්‍රමය පිළිබඳ පැවති මෙම ව්‍යාකූල පසුබිම බ්‍රිතාන්‍ය ජාතිකයින්ට වතු වගාව සඳහා ඉන්දීය කුලී ශ්‍රමිකයින් මෙරටට ගෙන්වීමට හේතු වූ ප්‍රබලම කාරණය විය.

ඉහත සඳහන් කළ පසුබිමත් අනෙක් අතට බ්‍රිතාන්‍යයන්ට ඉන්දීය පහළ ශ්‍රමික කුල රාශියකින් සපයාගත හැකි අඩු වියදම් ශ්‍රමයත් හේතු කොටගෙන දකුණු ඉන්දීය කුලී ශ්‍රමිකයින් මෙරට කෝපි වගාව සඳහා ගෙන්වීම ආරම්භ කරන ලදී. මේ සඳහා ඉන්දීය ශ්‍රමිකයින් ගෙන්වා ගැනීම මුලින්ම සිදු වූයේ 1823 වර්ෂයේ දී ජෝර්ජ් බර්ඩ් විසින් 150 දෙනෙකු ගෙන්වීමත් සමඟය.[68] ඉන් පසු 1830 දශකයෙන් පසුව නොකඩවා ඉන්දීය ද්‍රවිඩ

---

[66] **එම,** පිටු. 82-83.
[67] කේ. ධර්මසේන, "කඳුරට වැවිලි කර්මාන්තය," **මහවැලි වංශය, I** කාණ්ඩය, මහවැලි සංවර්ධන අමාත්‍යාංශයඃ ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය, 1984, පි. 313.
[68] **එම,** පි. 314.

කම්කරුවන් සංක්‍රමණිකයින් ලෙස ශ්‍රී ලංකාවට පැමිණි අතර වතු භෝග වගාවේ දියුණුවත් සමඟ ඉන්දීය ද්‍රවිඩ සංක්‍රමණයේ ශීඝ්‍රතාව ද ඉහළ ගියේ ය. පහත දැක්වෙන්නේ 1840 සිට පස් අවුරුදු කාල සීමාවකට ඉන්දීයානු ශ්‍රමික සංක්‍රමණයේ සාමාන්‍ය ප්‍රමාණයයි.

වගු අංක 01: ඉන්දියානු සංක්‍රමණිකයින් පැමිණීම- පස් අවුරුදු සාමාන්‍ය ගණන

| **පස් වාර්ෂික කාල සීමාව** | **සංක්‍රමණික ප්‍රමාණය** |
|---|---|
| 1840-44 | 26335 |
| 1845-49 | 44644 |
| 1850-54 | 45875 |
| 1855-59 | 66351 |
| 1860-64 | 65558 |
| 1865-69 | 66859 |
| 1870-74 | 89608 |
| 1875-79 | 123334 |
| 1880-84 | 47075 |
| 1885-89 | 47784 |

මූලාශ්‍රය:- කේ. ධර්මසේන, "කඳුරට වැවිලි කර්මාන්තය," මහවැලි වංශය, 1 කාණ්ඩය, 1984, පි. 314.

19 වන සියවස අගභාගය වන විට මෙම ජනතාව ශ්‍රී ලංකාවේ මධ්‍යම කඳුකරයේ මහනුවර, නුවරඑළිය, මාතලේ සහ බදුල්ල යන දිස්ත්‍රික්කයන්හි නිත්‍ය පදිංචි කරුවන් බවට පත් වූහ. ඉන්දීය ද්‍රවිඩ නැතහොත් වතු ද්‍රවිඩ වශයෙන් අනන්‍යතාව සහිත මෙම ජන කණ්ඩායම මධ්‍යම කඳුකරයේ සුවිශේෂී සංස්කෘතික කණ්ඩායමක් ලෙස සැලකිය හැකිය. උපතින් සියලු දෙනාම පාහේ හින්දු ආගමිකයින් වන අතර මෙරටට සංක්‍රමණය වීමෙන් පසුව කතෝලික ආගමේ ව්‍යාප්තියත් සමඟ බොහෝ පිරිසක් ක්‍රිස්තියානිකරණයට ලක් විය. එනිසාම ඇතැම් වතු ජනයාගේ නම් කතෝලික හා හින්දු ද්‍රවිඩ අනන්‍යතාවයන් සම්මිශ්‍රිතව සැකසී ඇති බව දැකගත හැකිය. නමුත් බොහෝ දෙනෙක් ද්‍රවිඩ හින්දු භක්තිකයින් වශයෙන් තම ආගමික හා නම්ගම්වල අනන්‍යතාව එසේම පවත්වාගෙන යති.

භූගෝලීය වශයෙන් මෙන්ම සමාජ සංස්කෘතික වශයෙන් ද මෙම වතු ප්‍රජාව සුවිශේෂී අනන්‍ය ජනකොටසකි. නමුත් වතු අංශය තුළ භූගෝලීය වශයෙන් මෙන්ම සමාජයීය වශයෙන් ප්‍රධාන සමාජයේ සමාජ-ආර්ථික දේශපාලනික සන්දර්භයෙන් ආන්තික වූ "වැසුණු" ප්‍රජාවක ලක්ෂණ දැක ගත හැකිය.[69] මේ වන විටත් සමාජආර්ථික තත්වයෙන් ප්‍රධාන සමාජයට සාපේක්ෂව යම් පහළ මට්ටමක් පෙන්වන වතු අංශයේ සමාජආර්ථික හා සෞඛ්‍යය ගැටලු ගණනාවක් පවතී. ළමා මන්ද පෝෂණය හා කාන්තාවන්ගේ නිරුක්තිය පිළිබඳ තවමත් ඉහළම අගයන් වාර්තා වන්නේ වතු අංශය හා සම්බන්ධ ප්‍රජාවගෙනි. ඔවුන්ට පවතින අවම පහසුකම්, ආහාර චර්යාව, සනීපාරක්ෂක පුරුදුවල පවතින දුර්වලතා, මව්වරුන්ගේ පවතින අඩු අධ්‍යාපන තත්ත්වය වැනි සාධකයෝ එහිලා ප්‍රබල වශයෙන් හේතු වේ.[70]

වතු ද්‍රවිඩ ජනතාවගේ නිවාස, "ලයින් කාමර" හෙවත් පේළි නිවාස ලෙස හැඳින්වේ. කාමර එකිනෙකට සම්බන්ධ වන ලෙස ඉදි කර ඇති "ලැයිම" තුළ ජනතාව එක්ව වසති. බොහෝ ලැයින් නිවාස 1970 ට පෙර නිමවා ඇති අතර එක් කාමරයක දළ ඉඩ ප්‍රමාණය වර්ග අඩි 250 ක් හෝ ඊට වැඩි නැත. පවුලේ සියලු දෙනා මෙම කාමරය තුළ ජීවත් වන අතර මෑත කාලය වන විට පෞද්ගලික වතු අංශය, රාජ්‍ය අංශය හා රාජ්‍ය නොවන සංවිධානවල සංවර්ධන අවධානය ප්‍රසාරණය වීමත් සමග නිවාසවල පුළුල් වීමක් සහ තරමක පහසුකම්වලින් යුත් නව නිවාස ඉදි කිරීම පිළිබඳවත් අවධානය යොමුවී ඇත. නමුත් සමස්තය සැලකිය යුතු මට්ටමක වෙනසකට භාජනය වී නොමැත. මෙම ප්‍රජාවේ කාන්තාවෝ දෛනිකව තේ දළු නෙළීමෙහි නියුක්ත වන අතර වැඩිහිටි පිරිමි තේ ගස් කප්පාදුව, කානු කැපීම, පස සැකසීම, පොහොර හා අනෙකුත් රසායන ද්‍රව්‍ය ඉසීම හා වල් ගැළවීම වැනි රාජකාරිවල නිරත වෙති. වැඩිහිටි ගැහැනු පිරිමි දෙකොටසම බහුතරයක් ස්ථිර වතු සේවකයින් ලෙසටත් තවත් කොටසක් තාවකාලික හෝ කොන්ත්‍රාත් පදනම යටතේත් දෛනිකව සේවයේ නියුක්ත වෙති. කුඩා දරුවන් රැක බලා ගැනීම වැඩිහිටි ගැහැනු දරුවන් විසින් හෝ වයෝවෘද්ධ දෙමාපියන් විසින් සිදු කරන්නාහ. එසේ නොමැති විට රැකියාවට යන මව තම දරුවා වත්තෙහි පිහිටි දාරකාගාරයට හෙවත් "පුල්ලෙ මඩුව" තුළ තබා රාජකාරිය අවසන් වූ පසු ඔවුන් කැටුව තම වාසස්ථානයට පැමිණෙති. ප්‍රධාන ආහාර වේල්වලින් වැඩි ප්‍රමාණයක් "රොටි" යොදා ගන්නා අතර පෝෂණීය හා සමබර ආහාරවේලක් නොගැනීම ප්‍රබල සෞඛ්‍යය තර්ජනයන්ට හේතු වී තිබේ. අනෙක් අතට ගැහැනු දරුවෙකුගේ වැඩි විය පැමිණීම විවාහය වැනි ජීවන චක්‍ර උත්සවවල දී හා ප්‍රධාන ආගමික උත්සවවල දී විශාල මුදලක් වියදම් කරන මෙම ප්‍රජාවෙහි පවතින දුර්වල කළමනාකරණය තවදුරටත් ඔවුහු දරිද්‍රතාවයෙහි ගිල්වා තැබීමට හේතු වී තිබේ. එබැවින් අදටත් ශ්‍රී ලංකාවේ වැඩිම දිළිඳු ජනගහණයක් ජීවත් වන කලාපය ලෙස වතු වගාව ආශ්‍රිත ප්‍රදේශ හැඳින් විය හැකිය.

නමුත් වර්තමානය වන විට සමාජආර්ථික, දේශපාලනික වෙනසත් සමග වතු ප්‍රජාවේ පවතින වැසුණු ස්වභාවය ක්‍රමිකව අඩුවෙමින් යනු පෙනේ. ඊට එක් ප්‍රධාන හේතුවක් වන්නේ ඔවුන්ගේ පවතින සමාජආර්ථික හා සෞඛ්‍ය ගැටලු හේතුවෙන් රාජ්‍ය හා රාජ්‍ය නොවන අංශයන්හි සංවර්ධන අවධානයට පුළුල් ලෙස ලක් වීමත්, එම නිසා සජීවීකරණ ක්‍රියාවලිය හරහා පවතින තත්ත්වයෙන් ඉහළට ඔවුහු රැගෙන ඒමේ ප්‍රතිඵල ලෙස මෙම ආවෘත්ත ලක්ෂණයන් බැහැර වීමත් ය. වතු අංශය නොබෝ කලකින් මුහුණ දෙන ගැටලුව බවට පත්වන්නේ වතු අංශයේ රැකියාවන්ට අවශ්‍ය ශ්‍රමය සපයා ගැනීමේ දුෂ්කරතාව යි. ඊට ප්‍රබල හේතුව වන්නේ වර්තමාන තරුණ පරපුර තවදුරටත් වතු අංශය තුළ රැඳී සිටීමට ප්‍රියතාවයක් නොදක්වන අතර ඔවුහු ඉතා වේගයෙන් නාගරික හා උපනාගරික කලාපයන් වෙත ඇදී ඒමයි. නුපුහුණු ශ්‍රමිකයින් ලෙස මෙලෙස සංක්‍රමණය වන තරුණ තරුණියන් ඊට ප්‍රධාන හේතුව ලෙස දක්වන්නේ තවදුරටත් තරුණ බලාපොරොත්තු හා ඉඩ ප්‍රස්තා

---

[69] O. Hollup, **Bonded Labour; Caste and Cultural Identity among Tamil Plantation Workers in Sri Lanka,** New Delhi: Sterling Publishers, 1994, p. XVI.

[70] තුෂාර කමල්රත්න, ශ්‍රී ලංකාවේ වතු අංශයේ ළමා මන්ද පෝෂණය හා දරිද්‍රතාවය පිළිබඳ සමාජවිද්‍යාත්මක විග්‍රහයක්, **සමාජවිමසුම**, කලාපය 16, 2016

සැපයීමට වතු අංශයට නොහැකි බවයි.[71] එම නිසා ඉතාම කෙටිකලක් තුළ වතු අංශයේ ප්‍රබල සමාජ-ආර්ථික ප්‍රතිපත්තීන්හි ප්‍රතිසංස්කරණයන් සාධනීය මට්ටමින් සිදු නොවුනහොත් වතු අංශය දෙදරා යෑමේ දැඩි අවධානමක් පවතී.

**මුස්ලිම් ප්‍රජාව පිළිබඳ කෙටි සටහනක්**

අනුජන කණ්ඩායම් පිළිබඳව සාකච්ඡා කිරීමේ දී මෙරට ජන වාර්ගික කණ්ඩායමක් ලෙස සැලකෙන මුස්ලිම් ජනතාව පිළිබඳව සටහනක් තැබීමට අපේක්ෂා කරනුයේ විශේෂයෙන් උඩරට රාජධානියේ ඓතිහාසික කාල වකවානුවෙහි දී මුස්ලිම් ජනතාව අනුජන කණ්ඩායමක් වශයෙන් නිර්මාණය කර තිබූ සමාජ ආර්ථික, සංස්කෘතික සහ දේශපාලනික වටපිටාව පිළිබඳව කෙටි විමර්ශනයක යෙදීම මෙම කතිකාවට ගෝචර වන බැවිණි.

මුස්ලිම් ජනතාව සාහිත්‍යයෙහි සහ එදිනෙදා ව්‍යවහාරයෙහි විවිධ නාමයන්ගෙන් හඳුන්වා ඇත. තම්බි, මුස්ලිම්, මරක්කල යන නම්වලින් සිංහල ජනතාව විසිනුත් පෘතුගීසීන් විසින් මුවර් යන නමිනුත් මුස්ලිම් ජනතාව හඳුන්වා ඇත.[72] මුස්ලිම් ජනතාව මෙරට ජන කණ්ඩායමකට කුමන කාල වකවානුවක සංයුති ගත වූයේ ද යන්න නිශ්චිතවම ප්‍රකාශ කළ නොහැකිය. මෙරට පැරණි මානව වංශ ලේඛනයන්හි පවා මෙම ඉතිහාසය සෙවීම උගහටය. ජෝන් ඩේවි තම වාර්තාවන්හි දක්වන්නේ මුස්ලිම් ප්‍රජාවේ ප්‍රභවය හෝ ඔවුන් පළමුවෙන් ලංකාවට පැමිණි කාල පරිච්ඡේදය නිශ්චය කර ඇති බවක් ඔහු නොදන්නා බව යි.[73] මුස්ලිම් ජනතාවගේ ආගමනය ඉන්දියන් සාගරයෙහි සමුද්‍රාශ්‍රිත වෙළෙඳාමේ ආරම්භයත් සමඟ සිදු වූ විදේශ සම්බන්ධතා මත සිදු වීය යන්න ප්‍රබල මතයකි. ඉන්දියන් සාගරය ප්‍රමුඛ කර ගනිමින් ඒ අවට නගර සහ වරායවල් හරහා සංවර්ධනය වූ වාණිජ කටයුතුවලට දීර්ඝ ඉතිහාසයක් ඇති අතර ක්‍රි. පූ. 3 වන සියවසයේ ඉන්දියාවේ හරප්පා ශිෂ්ටාචාරයේ වෙළෙඳුන් පර්සියානු බොක්කේ වරායවල් හරහා මෙසපොතේමියාව සමඟ වෙළෙඳාම් කර ඇති බවටත්, මෙම කාලය තුළ හෝ ඊට පෙර සිට පාරාවරුන්ගේ ඊජිප්තුව දකුණු අරාබියානු සහ රතු මුහුද ආශ්‍රිත වෙරළ ප්‍රදේශ සමඟ වාණිජ සම්බන්ධතා ස්ථාපිත කරගෙන තිබූ බවට තොරතුරු සපයාගත හැකිය.[74]

සාක්ෂිවලට අනුව ඉන්දියන් සාගරය ආශ්‍රිත වෙළෙඳකටයුතුවල දී “පර්සියන්වරු” ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කළ අතර “සැසේනියානු පර්සියන්වරු” මෙහි ප්‍රධාන වෙළෙඳ කණ්ඩායමක් බවට පත් විය. ශ්‍රී ලංකාව සැසේනියානු පර්සියන්වරුන්ගේ ප්‍රධානතම වෙළෙඳ මධ්‍යස්ථානය බවට පත්ව තිබූ අතර මෙම සම්බන්ධතාව ඉස්ලාම් දහම සහ අරාබි මුස්ලිම් කලාපය සමඟ ශ්‍රී ලංකාව ඓතිහාසික වශයෙන් ඇති කරගෙන තිබූ සම්බන්ධතා පැහැදිලි කරන්නක් විය හැකිය.[75] කෙසේ වෙතත් ක්‍රි. ව. 7 වන සියවසයේ දී ඉස්ලාම් දර්ශනය බිහිවීමත් සමඟ අරාබිවරු දේශපාලනික, ආගමික සහ වාණිජ යන අංශ ඒකාබද්ධ කර ගත් සංවිධානාත්මක බලවේගයක් වශයෙන් ඉදිරියට පැමිණෙන ලදී. එහිදී ඉන්දියන් සාගරය යටතේ තිබූ සමුද්‍රාශ්‍රිත වෙළෙඳාම මෙහි ඒකාධිකාරය සියතට ගත් ඔවුහු මලබාරය සහ දකුණු ඉන්දියාවේ නොයෙකුත් ප්‍රදේශවලත්, ඇතැමුන් ශ්‍රී ලංකාවේ කොළඹ සහ ගාල්ල කොටුවලත් පදිංචි වූහ.[76] නව වන හා දහ වන ශතවර්ෂයන්හි දී ශ්‍රී ලංකාව අරාබිය සමඟ රාජ්‍යතාන්ත්‍රික සබඳතා පැවැත් වූ බවට සාක්ෂි ඇති අතර දහ වන හා දොළොස් වන සියවස් අතර කාලය තුළ මෙරට සංචාරය

---

[71] Thushara Kamalrathne & Hiranthi Galahitiyawa, “Changing Aspriations & Values among Youth in the Plantation Sector in Sri lanka,” **The Plantation Sector in Transition: Research on the Up-Country Plantation Sector in Sri Lanka,** University of Peradeniya, Department of Sociology" 2010.
[72] මීගස්කුඹුර, **එම,** 1985, පි. 625.
[73] ජෝන් ඩේවි, **ඩේවි දුටු ලංකාව,** අනු: ඇල්ලේපොළ එච්. එම්. සෝමරත්න, කොළඹ: එම්. ඩී. ගුණසේන සහ සමාගම, 1967, පි. 62.
[74] සිරිමා කිරිබමුණේ, “ඉස්ලාම් ධර්මය බිහි වීමේ සිට පහළොස්වන සියවස දක්වා කාලය තුළ අරාබි මුස්ලිම්වරුන්ගේ වාණිජ කටයුතු,” **ඉඳුවර,** පරි: රෝහිත දසනායක, වරකාපොළ: ආරිය ප්‍රකාශකයෝ, 2002, පි. 137.
[75] සෝමරත්න, **එම,** 1967, පි. 146-149.
[76] මීගස්කුඹර, **එම,** 1985, පි. 625.

කළ ගවේෂකයින්ගේ ලේඛනවල ශ්‍රී ලංකාව සමග පැවති සම්බන්ධතාවය අනාවරණය කොට ඇත.[77] කෙසේ වෙතත් පහළොස්වන සියවස පමණ වන විට ලංකාව සමඟ පැවති මුස්ලිම් වෙළෙඳ කටයුතු යම් ඒකාධිකාරිත්වයක් ද සහිතව වර්ධනය වූ අතර පෙර සාකච්ඡා කළ වෙළෙඳ, ආගමික සහ දේශපාලනික වශයෙන් මත වූ ඒකාබද්ධ සම්බන්ධතාවයන් වඩා පුළුල් මට්ටමකට පත් වූ බව දැකිය හැකිය.

ලෝකයේ විවිධ භූගෝලීය කලාපවලින් මෙරටට සංක්‍රමණය වූ මුස්ලිම් ජාතිකයින් හැඳින්වීම සඳහා විවිධ නම් භාවිත කරන ලදී.

> "ලංකාවේ මුස්ලිම්හු ප්‍රධාන කොටස් දෙකකි. කෙළින්ම අරාබිකරයෙන් ආවෝ 'සෝනහාර්' නමින් ද දකුණු ඉන්දියාවෙන් ආවෝ 'සම්මාන්' යි ද හැඳින් වෙති... ලන්දේසීන් විසින් යුද සමයේ දී ගෙන්වා ගන්නා ලද 'මැලේ' මුස්ලිම්වරු මේ කොටස් දෙකටම වඩා අමුතු සංස්කෘතික ලක්ෂණ ඇත්තෝ ය. එසේම කොචින් පෙදෙසින් ආ 'කොච්චි මුස්ලිම්හු' ද 'බෝරා මුස්ලිම්හුද' ස්වල්ප වශයෙන් මෙහි වෙති." [78]

ඉහත විග්‍රහයෙහි මැලේ මුස්ලිම්වරුන් ලෙස හඳුන්වන කොටස මැලේ දූපත් සහ මැලේසියාව කේන්ද්‍ර කරගත් නැගෙනහිර ආසියාතික කලාපයේ මුල්භූමි ඇත්තවුන් වන අතර ශ්‍රී ලංකාවේ මැලේ ප්‍රජාව 'ජා මිනිසුන්' ලෙස හඳුන්වනු ලබන්නේ ඉන්දුනීසියානු දූපත් සමූහයේ ජා දූපතේ සිට සංක්‍රමණය වූ බැවින් විය හැකිය. පළමුවෙන්ම මැලේ ජාතිකයන් මෙහි ගෙන්වනු ලද්දේ පෘතුගීසීන් විසින් බවටත්, කොම්පඤ්ඤ වීදිය කේන්ද්‍ර කරගනිමින් වර්ධනය වූ මැලේ ප්‍රජාව ගෙනෙන ලද්දේ ලන්දේසීන් සහ ඉංග්‍රීසීන් විසින් බවටද සාක්ෂි ඇත.[79]

පෘතුගීසීන්ගේ තාඩන පීඩනයන්ට ලක්ව පලා ආ මුස්ලිම්වරුන්ට සිංහල රජවරු විසින් අනුකම්පා සහගතව ආරක්ෂාව ලබා දුන් අතර මහනුවර හා මඩකලපුව අතර ප්‍රදේශවල පදිංචි වීමටත් රට තුළ වෙළෙඳාම් කිරීමටත් අවසර ලබා දී ඇත.[80] මෙම පරිච්ඡේදයේදී ම අප සාකච්ඡා කළ පරිදි, පෘතුගීසි සිංහලයෝ බිහිවන්නේ මෙපරිද්දෙන් ම ලන්දේසින්ට බියේ උඩරට රජුගේ ආරක්ෂාව පතා පලා ආ පෘතුගීසින්ට උඩරට රාජ්‍යය තුළ පදිංචි වීමට සහ සිංහල කුල කතුන් විවාහ කර ගනිමින් සමාජ සංවිධානයට එක් වීමට අවස්ථාව ලබාදීමේ ප්‍රතිඵලයක් වශයෙනි. කෙසේ වුව ද පසුකාලීනව මුස්ලිම් ප්‍රජාව මෙරට සමාජ සංවිධානයේ අත්‍යාවශ්‍ය සේවා කාණ්ඩයක් බවට පත් වූ බව ඓතිහාසික මූලාශ්‍රයන්ගෙන් පැහැදිලි වේ. විශේෂයෙන් උඩරට රාජධානියේ රාජකාරී ක්‍රමය තුළට පවා මුස්ලිම් ජනතාව අන්තර්ග්‍රහණය කළ බව දැකිය හැකි ය. මුස්ලිම් ජනයා වාණිජ්‍ය මූලික කර ගනිමින් ජීවිකාව ගත කළ අතර උඩරට සිංහල කුල සංවිධානයේ 'කරාව' කුලයට සමගාමීව සේවා සංවිධානය කොට තිබිණ.

ඩේවිට අනුව උඩරට සේවා බද්ද (කාර්යාංශ) 12ක් වශයෙන් සංවිධානය වී තිබූ අතර ඒවාට බද්දේ නිලධාරීන් වශයෙන් නිලමේවරුන් පත්කොට තිබිණ. එම කාර්යාංශයෝ නම් මඩිගේ බද්ද, කොට්ටල් බද්ද, බඩහැල බද්ද, රදා බද්ද, මහ බද්ද, හුණු බද්ද, වී බද්ද, කින්නර බද්ද, අනිල බද්ද, සුළං බද්ද, රහු බද්ද සහ ලුණු බද්ද වේ.[81] මඩිගේ හෙවත් ප්‍රවාහන කාර්යංශය ප්‍රධාන පංති දෙකකින් සමන්විත වේ.

1. කරාවේ කුලිකයෝ හෙවත් ධීවර කුලයේ ප්‍රජාව- මෙම කොටස සේවා ඉඩම් භුක්ති විඳිනු ලැබූ අතර ඉඩම් සහිත ස්ථිර පංතියක් ලෙස සැලකිණ.

---

[77] කිරිබමුණේ, **එම,** 2002, පිටු. 149-157.
[78] මීගස්කුඹුර, **එම,** 1985, පි. 625.
[79] මංජුල වෙඩිවර්ධන, "මුස්ලිම් නෙවෙයි අපි මැලේ," **ජන විවධත්වය,** මහරගම: රාවය පබ්ලිෂර්ස්, 2007, පිටු. 152-154.
[80] මීගස්කුඹුර, **එම,** 1985, පි. 625.
[81] සෝමරත්න, **එම,** 1967, පි. 72.

2. සුළං බද්ද මඩිගේ- මෙය මරක්කලයන්ගෙන් සමන්විත වූවකි.[82] සේවා ඉඩම් හිමිකම ලැබුණේ නැත. (හුළං යන්නෙහි ඇරුත කිසිවක් නැත යන්නයි. එබැවින් ස්ථිර වාසයක් හෝ පදිංචියක් නැති බැවින් මෙය භාවිත වන්නට ඇත.)

"මේ දෙපංතියේම ප්‍රධාන වස්තුව ගවයන්ගෙන් සමන්විත විය. රජය ඔවුන්ට දෙන ආරක්ෂාව සහ ඔවුන් භුක්ති විඳින ඉඩම් වෙනුවෙන් පළමු පංතියට අයත් මඩිගේ මිනිසුන් රජුගේ හාල් සහ වී රජුගේ මහා ගබඩාවට ගෙන යාමට අවශ්‍ය වූ විට තම මෙවලම් ගොනුන් සහිතව පෙනී සිටීමට බැඳී සිටියහ. මෙයට අමතරව ඔවුහු සුළු බද්දක් ලුණු, කරවල සහ බවබෝග මඟින් ගෙවූහ. සුළං මරක්කලයින් තවලම් කටයුතු සඳහා යොදවන ලද්දේ හදිසි අවස්ථාවල දී පමණි. ඔවුහු භාණ්ඩාගාරයෙන් ලත් මුදල් යොදා රජු වෙනුවෙන් වෙළෙඳාම් කිරීමට පත් කරන ලදී."[83]

ඩොයිලි අනුව යමින් පීරිස් විසින් දක්වා ඇත්තේ මරක්කලයන්ට උඩරට පදිංචි වීමට ලබා දී තිබූ අවසරයට ප්‍රමාණවත් වන්දියක් වශයෙන් තමන්ගේම මුදලින් මුහුදුබඩින් මිලදී ගත් ලුණු සහ කරවල කිසිඳු ගාස්තුවකින් තොරව කප්පම් වශයෙන් රාජකීය ගබඩාවට සැපයූ බවයි. එසේම මහනුවර යුගයේ අපර භාගයේ දී යුද කටයුතු ආදිය අධික වීම නිසා ගවයින්ගේ සේවය ලබා ගැනීමට මඩිගේ කාර්යංශයට සීමා රහිත විධානයන් ලැබුණු බවයි.[84]

වර්තමානයේ ශ්‍රී ලංකාවේ ප්‍රජා විද්‍යාත්මක වෙනස්කම් පිළිබඳව සලකා බලන විට මුස්ලිම් ජනගහනය අනෙකුත් ජනවාර්ගික කණ්ඩායම්වලට සාපේක්ෂව තරමක ඉහළ ජනගහන වර්ධනයකින් යුක්ත වේ. එය එක් අතකින් ජනගහනය පිළිබඳ ඉස්ලාමීය දර්ශනය සහ මුස්ලිම් ප්‍රජාවගේ සංස්කෘතිකමය ලක්ෂණයන්ගේ ප්‍රතිඵල ලෙස මතු වී ඇති බව පෙනේ. පහත වගුවෙන් දැක්වෙන්නේ 1981 සංගණන වර්ෂය සහ 2001 සංගණන වර්ෂය අතර මධ්‍යම පළාත් අතර ජනවාර්ගික කණ්ඩායම්හි ප්‍රාමාණික වර්ධනය යි.

වගු අංක - 2

මධ්‍යම පළාත තුළ ජනවාර්ගිකත්වය අනුව ජනගහනයේ වෙනස් වීම. (1981-2001)

| | 1981 | | | 2001 | | |
|---|---|---|---|---|---|---|
| ජනවර්ගය | මහනුවර | මාතලේ | නුවරඑළිය | මහනුවර | මාතලේ | නුවරඑළිය |
| සිංහල | 74.3 | 79.9 | 42.1 | 74.1 | 80.1 | 40.2 |
| ශ්‍රී ලංකා දෙමළ | 5.0 | 5.8 | 12.7 | 4.1 | 5.5 | 6.5 |

[82] පීරිස්, එම, 1964, පි. 196.
[83] සෝමරත්න, එම, 1967, පි. 62.
[84] පීරිස්, එම, 1964, පි. 196.

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ඉන්දියානු දෙමළ | 9.4 | 7.0 | 42.7 | 8.1 | 5.3 | 50.6 |
| ශ්‍රී ලංකා මුවර්ස් | 10.5 | 7.0 | 2.0 | 13.1 | 8.7 | 2.4 |
| බර්ගර්ස් | 0.2 | 0.1 | 0.1 | 0.2 | 0.1 | 0.1 |
| මැලේ | 0.3 | 0.2 | 0.2 | 0.2 | 0.1 | 0.2 |

මූලාශ්‍ර: Lona Devaraja, The Muslims of Sri Lanka, The Lanka Islamic Foundation: Colombo, 1994 and Economic and Social Statistics in Sri Lanka, Department of Census and Statistics, 2012.

කෙසේ වුවත් මැලේ මුස්ලිම්වරු බ්‍රිතාන්‍ය පාලන කාලයේ ඉහළ සමාජ ආර්ථික චලනයතාවක් ඇති කරගන්නා ලදී. ඉංග්‍රීසි පාලකයින් මැලේ ජනතාව පොලිස් සේවයට බඳවා ගෙන මැලේ රෙජිමේන්තුව පිහිටුවන ලද අතර 1813 දී රොබට් බ්‍රවුන්රිග් ආණ්ඩුකාරයාගේ පාලන තන්ත්‍රය තුළ සුරාබායා රාජ්‍යයෙන් මැලේ මිනිසුන් 413 ක් ගෙනැවිත් මැලේ රෙජිමේන්තුවට අනුයුක්ත කර ඇති අතර 1816 දී ජාවා සොල්දාදුවන් 228ක් පවුලේ සමාජිකයන් ද සමඟ මැලේ රෙජිමෙන්තුවට ගෙන එන ලද බවත් 1827 දී මෙම රෙජිමේන්තුව ලංකා රයිෆල් රෙජිමේන්තුව ලෙස ස්ථාපිත කළ බවත් වාර්තා වේ.[85] 20 වන සියවසේ මැද භාගයේ දී ගිනි නිවන හමුදාවේ බහුතරයක් සහ වතු සමාගම්වල ඉංග්‍රීසි විධායකය සහ කම්කරුවන් අතර සිටි පරිපාලන ස්ථරයේ බහුතරය මැලේ ජාතිකයන්ගෙන් සැදුම් ලද්දේය.

**නිගමනය**

සමාජ නවීකරණයත් සමඟ බොහෝ ජනකණ්ඩායම් හි සංස්කෘතික අනන්‍යතාවයන් ක්‍රමයෙන් ගිලිහී යෑම නිසඟයෙන් සිදුවන්නෙකි. එසේ වුව ද ශාස්ත්‍රීය අභිලාසයෙන් එවැනි ජන අනන්‍යතාවයන් පර්යේෂණයන්ට බඳුන් කිරීමත්, අනාගත පර්යේෂකයන්ට පාඨනය කිරීම උදෙසා වර්තා කිරීමත් කාලෝචිත වන්නේය. මෙම පර්යේෂණ ලිපියෙහි මුඛ්‍ය අභිලාෂය වූයේ ශ්‍රී ලංකාවේ මධ්‍යම කඳුකර කලාපය සහ ඒ අවට විවිධ ප්‍රදේශවල ජීවත් වූ ජනකණ්ඩායම් කිහිපයක සංස්කෘතික අනන්‍යතාවයන් මානවවිද්‍යාත්මක පර්යාවලෝකයකින් විග්‍රහ කිරීම සහ වාර්තා කිරීමයි. ආදිවාසී ජනයා හැරුණු කොට මෙම ලිපියෙහි සාකච්ඡාවට බඳුන් කොට ඇති ජනකණ්ඩායම් හි අනන්‍යතාවයන් බොහොමයක් සම්ප්‍රදායික කුලක්‍රමය, රැකියා, සහ ජනවර්ගය අභිමුඛව ගොඩනැගී ඇත.

මෙම ලිපියෙහි එන බොහෝ ජනකණ්ඩායම් එක්තරා ආකාරයක සමාජ ආන්තිකරණයකට ලක්ව ඇති බව පැහැදිලිය. ඒවාට මූලසාධක බොහොමයක් ඓතිහාසිකව ගොඩනැගුණු සමාජ සංස්කෘතික කරුණු පදනම් කරගෙන නිමැවුනු ආකල්ප, මතිමතාන්තර වැනි මානසික ප්‍රකාශනයන්ය. අනෙක් අතට ආවේණික ජීවනෝපායන්හි යෙදෙන බොහෝ ජන කණ්ඩායම් හි පළමු සහ දෙවන පරම්පරා නූතන තරගකාරි

85 වෙඩිවර්ධන, එම, 2007, පි. 156.

වෙළෙඳපළ ක්‍රමයෙහි අසරණයන් බවට පත්ව සිටිති. එබැවින් මෙම කණ්ඩායම් වර්තමානයේ මුහුණ දී ඇති සමාජ ආර්ථික අර්බුද පිළිබඳ පර්යේෂකයින් මෙන්ම ප්‍රතිපත්ති සම්පාදකයින් ද සාධනීය අවධානයක් යොමු කිරීම අත්‍යවශ්‍යය.

**සමුද්දේශ**


මහාවංශය, 1952, තෘතීය මුද්‍රණය, පරි: හික්කඩුවේ නායක ස්ථවිරපාදයන් වහන්සේ දොන් ආන්ද්‍රිස් ද සිල්වා බටුවන් තුඩාවේ, ආණ්ඩුවේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව.

උල්ලුවිස්හේවා, පී. 2008, *උඩරට සංස්කෘතික අභිමානය*, කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ඔබේසේකර, ගණනාථ 2005, *රාවණා රාජාවලිය සහ උපත් කථා*, කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

කිරිබමුණේ, සිරිමා. "ඉස්ලාම් ධර්මය බිහි වීමේ සිට පහළොස්වන සියවස දක්වා කාලය තුළ අරාබි මුස්ලිම්වරුන්ගේ වාණිජ කටයුතු," *ඉඳුවර*, පරි: රෝහිත දසනායක, වරකාපොළ: ආරිය ප්‍රකාශකයෝ, 2002, පි. 137.

කුමාරස්වාමි, ආනන්ද. *මධ්‍යකාලීන සිංහල කලා*, කොළඹ: සංස්කෘතික දෙපාර්තමේන්තුව, 1962, පි. 241.

ඩොයිලි, ජෝන් 2011, *ඩොයිලි දුටු උඩරට රාජ්‍යය,* පරි: උපාලි රත්නායක, කොළඹ: ෆාස්ට් පබ්ලිෂන්.

නොක්ස්, රොබට් 2011, *එදා හෙළදිව,* අනු: ඩේවිඩ් කරුණාරත්න, කොළඹ: එම්. ඩී. ගුණසේන සහ සමාගම.

කමල්රත්න, තුෂාර, 2014, *ශ්‍රී ලංකාවේ වතු අංශයේ ළමා මන්ද පෝෂණය හා දරිද්‍රතාවය පිළිබඳ සමාජවිද්‍යාත්මක විග්‍රහයක්*, සමාජවිමසුම, කලාපය 16

පීරිස්, රැල්ෆ් 1964, *මධ්‍යකාලීන සිංහල සමාජ සංවිධානය*, බොරලැස්ගමුව: විසිදුණු ප්‍රකාශකයෝ.

බුධදත්ත හිමි, පොල්වත්තේ 1961, *චීන තෙරුන්ගේ ගමන් විස්තර හා හියුංසියං භ්‍රමණ වෘතාන්තය*, අම්බලම්ගොඩ: ආනන්ද පොත් සමාගම.

සෙලිග්මාන්, සී. ජී. සහ වෙනත් අය 2009, *වැද්දෝ*, පරි: චන්ද්‍ර ශ්‍රී රණසිංහ, කොළඹ: ෆාස්ට් පබ්ලිෂින්.

අතරගල්ල, කමලා 2009, "මාතලේ සහ කුරුණෑගල ආදිවාසී ගම්මාන," *ශ්‍රී ලංකාවේ ප්‍රාථමික ජනසමාජ, ආදිවාසී ජන අධ්‍යයන කේන්ද්‍රය*: ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය, කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ, පිටු. 36-49.

මද්දුමබණ්ඩාර, සී. එම්. 1984, "මහවැලිය සහ සිංහලයේ හදබිම," *මහවැලි වංශය, II කාණ්ඩය*, මහවැලි සංවර්ධන අමාත්‍යංශය: ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය.

මීගස්කුඹුර, පී. බී. 1985, "විශේෂ ජනකොට්ඨාස," *මහවැලි වංශය, II කාණ්ඩය*, මහවැලි සංවර්ධන අමාත්‍යංශය: ඉන්ජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය.

දැරණියගල, ශිරාන් 1984, "ප්‍රාග් ඓතිහාසික පසුතලය," *මහවැලි වංශය, I කාණ්ඩය,* මහවැලි සංවර්ධන අමාත්‍යංශය, ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය.

ධර්මසේන, කේ. 1984, "කඳුරට වැවිලි කර්මාන්තය," *මහවැලි වංශය, I කාණ්ඩය,* මහවැලි සංවර්ධන අමාත්‍යාංශය: ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය.

වෙඩිවර්ධන, මංජුල. "මුස්ලිම් නෙවෙයි අපි මැලේ," *ජන විවධත්වය*, මහරගම: රාවය පබ්ලිෂර්ස්, 2007, පිටු. 152-154.

වීරරත්න, විමලනාත් 2007, "දුම්බර රටා මැවූ කින්නර පරපුර," *ජන විවිධත්වය*: ශ්‍රී ලංකාවේ ජන කණ්ඩායම්වල සම්භවය පරිණාමය සහ වත්මන් දිවි සැරිය පිළිබඳ පැතිකඩක්, මහරගම: රාවය පබ්ලිෂර්ස්.

වීරරත්න, විමලනාත් 2007, "වහකෝට්ටේ පෘතුගීසි සිංහලයෝ," *ජන විවිධත්වය*: ශ්‍රී ලංකාවේ ජන කණ්ඩායම්වල සම්භවය පරිණාමය සහ වත්මන් දිවි සැරිය පිළිබඳ පැතිකඩක්, මහරගම: රාවය පබ්ලිෂර්ස්.

හෙට්ටිආරච්චි, තිලක් 1984, "මහවැලි කලාපයේ ඓතිහාසික විකාශනය," *මහවැලි වංශය, I කාණ්ඩය*, මහවැලි සංවර්ධන අමාත්‍යාංශය: ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය.

Herath, H. M. D. R., Rasnayake, S and Kamalrathne, T. 2011**,** *Either God or Devil: Beyond Buddhism- An Anthropological View of Yakkama Ritual,* Vol. XVI, Peradeniya University Research Session , Proceedings, University of Peradeniya.

Hollup, O. 1994, *Bonded Labour; Caste and Cultural Identity among Tamil Plantation Workers in Sri Lanka*, New Delhi: Sterling Publishers.

Kamalrathne, T. & Galhitiyawa, H, 2010, zzChanging Aspriations & Values among Youth in the Plantation Sector in Sri Lanka,ZZ *The Plantation Sector in Transition: Research on the Up Country Plantation Sector in Sri Lanka*, Department of Sociology, University of Peradeniya.

Kamalrathne, T. and Rasnayake, S. 2012, *An Anthropological Study of an Idiological Contradiction & the Dilemma of Positioning Goddess Pattini in the yakkama Ritual,* 5th Research Conference, Colombo: The Royal Asiatic Society of Sri Lanka.

Mackinder, H, J. 1904, "The Geographical Pivot of History," *The Geographical Journal*, Vol 23, No 4. Pp 421-437.